පුනරුත්ථාපන කාර්යාංශය

වාර්ෂික වාර්තාව - 2023

CM 041126 - 20 (2024/10) රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

දැක්ම

බුද්ධිමත්, නිරෝගීමත්, විනයගරුක අනාගත පරපුරක්
බිහි කිරීම

මෙහෙවර

අනාගත ශ්‍රී ලංකා සමාජය බුද්ධියෙන් පිරිපුන්, නිරෝගීමත්,
ශක්ති සම්පන්න, විනයගරුක මිනිසුන්ගෙන් යුත්
සමාජයක් ලෙස ගොඩනැගීම



පුනරුත්ථාපන කාර්යාංශ පාලක සභාවේ සභාපතිතුමාගේ පණිවිඩය

වර්තමානයේ අප දේශය තුළ ජාතික ව්‍යසනයක් බවට පත්ව ඇති අන්තරායකර ඖෂධ භාවිතය සඳහා ඇබ්බැහිවූවන් පුනරුත්ථාපන ක්‍රියාදාමය වෙත යොමුකර යහපත් පුරවැසියන් වශයෙන් සමාජගත කිරීමෙහිලා ජාතික මෙහෙවරක් සිදු කරනු ලබන අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පුනරුත්ථාපන කාර්යාංශයේ පාලක සභා සභාපති වශයෙන් පත්වීම මා ලැබූ භාග්‍යයක් වශයෙන් සලකමි. එමෙන්ම මෙම තනතුර සඳහා මා පත් කරන ලද අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගරු ආචාර්ය විජයදාස රාජපක්ෂ මැතිතුමන් වෙත ද මාගේ කෘතඥතාව මෙහිදී පළ කර සිටිමි.

මතින් නිදහස් රටක් බිහිකිරීමේ ජාතික දැක්ම පදනම් කරගනිමින් මත්ද්‍රව්‍ය භාවිතය සඳහා ඇබ්බැහිවී ඇති තැනැත්තන් ප්‍රතිකාර හා පුනරුත්ථාපනය සඳහා යොමු කරලීමේ ජාතික ආයතනයක් වශයෙන් ප්‍රතිකාර හා පුනරුත්ථාපනය සම්බන්ධයෙන් පවත්නා කාලීන අවශ්‍යතාවයන් හඳුනාගනිමින් පුනරුත්ථාපන කාර්යාංශය සිය සේවාවන් පුළුල් කරමින් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

දිවයින තුළ පවතින මත්ද්‍රව්‍ය ගැටලුවට විසඳුම් සොයනු වස් මත්ද්‍රව්‍ය භාවිතය සඳහා පෙළඹී ඇති තැනැත්තන් ප්‍රතිකාර හා පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමත් මත්ද්‍රව්‍ය දුර්භාවිතය අවම කිරීම පෙරදැරි කර ගනිමින් පාසල් දරුවන් ප්‍රමුඛ ප්‍රජාව මත්ද්‍රව්‍ය භාවිතය සඳහා ගොදුරුවීම වළක්වාලීමේ අවශ්‍යතාවය සපුරමින් පාසල් සිසුන්, තරුණ ප්‍රජාව, රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික ආයතනයන්හි නිලධාරීන් ඇතුළු සේවක සේවිකාවන් සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් වසර පුරාම සිදු කරමින් පුනරුත්ථාපන කාර්යාංශය දැවැන්ත මෙහෙවරක් සිදු කරන බව ඉතාමත් සතුටින් ප්‍රකාශ කර සිටිමි.

ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩසටහන් වලට අමතරව මෙම කාර්යාංශය වෙත යොමු කරනු ලබන පුනරුත්ථාපනලාභීන් වෘත්තීය පුහුණු වැඩසටහන් වෙත ද යොමු කර ඔවුන් සඳහා වෘත්තීය පුහුණුවක් ද ලබා දෙමින් ජාතික ශ්‍රම බලකායට දායක වන මනා පෞරුෂයෙන් හෙබි ජව සම්පන්න පුරවැසියන් පිරිසක් වශයෙන් දැයට දායාද කිරීම මෙම කාර්යාංශයේ ප්‍රධානතම අභිප්‍රාය වේ.

එමෙන්ම අන්තරායකර ඖෂධ සඳහා ඇබ්බැහිවූවන් මතින් මුදවාගැනීම සඳහා පුනරුත්ථාපන කාර්යාංශය තම සේවාවන් වඩාත් පුළුල්ව හා නව්‍ය ප්‍රවේශයන් ඔස්සේ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් ඉදිරියටත් අප මාතෘභූමිය උදෙසා සිය මෙහෙවර ඉටු කරනු ලබන බව ප්‍රකාශ කර සිටිමි.

ජනාධිපති නීතිඥ යූ. ආර්. ද සිල්වා
පාලක සභා සභාපති
පුනරුත්ථාපන කාර්යාංශය
2024 සැප්තැම්බර් මස 24 දින.



පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්තුමාගේ පණිවුඩය

අන්තරායකර ඖෂධ වලට ඇබ්බැහිවූවන් සහ පුනරුත්ථාපනය අවශ්‍ය වූ තැනැත්තන් යහමඟට ගැනීමේ පුනරුත්ථාපන වැඩසටහන මඟින් අපේක්ෂිත අරමුණු සඵල කර ගැනීමේ දැවැන්ත අභියෝගයට සාර්ථකව මුහුණ දීමේ වගකීම පුනරුත්ථාපන කාර්යාංශය වෙත පැවරී ඇත. එම අරමුණු ළඟා කර ගැනීමෙහිලා යන ගමන්මග ඉතාමත් දුෂ්කර හා අභියෝගාත්මක වුවද විවිධ වූ බාධක මධ්‍යයේ අපගේ අරමුණු ඉතා ඵලදායි අයුරින් සඵල කරගැනීම සඳහා ආයතනයක් වශයෙන් නිරන්තරයෙන් ඇපකැප වන්නෙමු. එය යථාර්ථයක් කරමින් මෙම කාර්යාංශය යටතේ ක්‍රියාත්මක ප්‍රතිකාර හා පුනරුත්ථාපන ක්‍රියාවලිය තුළින් සාර්ථක ප්‍රතිඵල ළඟා කර ගැනීමට හැකිවීම අප ලද ජයග්‍රහණයකි.

අන්තරායකර ඖෂධ භාවිතය වළක්වාලීම සඳහා වන එකම නිර්ණායකය පුනරුත්ථාපනය නොවූවද , මෙම ව්‍යසනකාරී තත්ත්වයෙන් රට බේරා ගැනීම සඳහා ක්‍රියාත්මක විවිධ ක්‍රියාකාරකම් අතුරින් පුනරුත්ථාපනයට හිමි වන්නේ සුවිශේෂී වූ ස්ථානයකි.

අප ආයතනය යටතේ වරකට 1300 කට ආසන්න විෂ මත්ද්‍රව්‍යයන්ට ඇබ්බැහිවූවන් ප්‍රමාණයක් පුනරුත්ථාපනය වන අතර, ඔවුන් එසේ පුනරුත්ථාපනය සඳහා යොමු නොකොට සමාජයේ රැඳුනහොත් පොදුවේ සමාජයට වන හානිය අතිමහත්ය. එමෙන්ම ඔවුන්ගේ දෙමාපියන්, අඹු දරුවන්ට වන මානසික පීඩනය ද, අසල්වාසින්ට මුහුණදීමට සිදු වන හිරිහැර මෙන්ම විෂ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන්ගේ ශරීර සෞඛ්‍යයට ඇති වන හානිය ද වළක්වා ගත නොහැක. තවද විෂ මත්ද්‍රව්‍යන්ට ඇබ්බැහිවූවන් රටේ ආර්ථිකයට සිදු කරනු ලබන අලාභය හා ඒ කෙරෙහි කිසිදු දායකත්වයක් ලබා නොදීම අපට නොපෙනෙන පැතිකඩකි.

එම තත්ත්වයන් හඳුනා ගනිමින් විද්වතුන්, වෘත්තීයවේදීන්, පුනරුත්ථාපනයේ දීර්ඝ කාලීනව නියැලී සිටීම තුළින් අප ලබා ඇති අත්දැකීම් මෙන්ම විවිධ ප්‍රතිකාර ක්‍රම හා ක්‍රියාකාරකම් ඇතුළත් වන පරිදි චර්යාත්මක හා ආකල්ප වර්ධනයන් ඉලක්ක කර සකස් කරන ලද විධිමත් විෂය නිර්දේශයන් යටතේ මෙම පුනරුත්ථාපන කාර්ය සිදු කරනු ලබයි.

සමාජය විසින් ප්‍රතික්ෂේපිත අන්තරායකර ඖෂධවලට ඇබ්බැහිවූවන් ප්‍රතිකාර හා පුනරුත්ථාපන ක්‍රියාවලිය හරහා රටට වැඩදායී, මනා පෞරුෂයකින් හෙබි සෞඛ්‍ය සම්පන්න, විනයගරුක යහපත් පුරවැසියෙකු ලෙස සමාජගත කිරීම සහ ජාතික ආර්ථිකයට දායකත්වයක් දියහැකි වෘත්තීය අධ්‍යාපනයක් සහිත ප්‍රජාවක් බිහි කිරීම පුනරුත්ථාපන කාර්යාංශයේ අපේක්ෂාවයි. එම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ආයතනයක් වශයෙන් අප තව දුරටත් නොපසුබටව කැපවෙමින් ක්‍රියා කරන්නෙමු.

ඩීඩීයූකේ හෙට්ටිආරච්චි ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී එම්ඒ
මේජර් ජෙනරාල් (විශ්‍රාමික)
පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්
2024 සැප්තැම්බර් මස 24 දින.

පටුන

පිටු අංකය

1. හැඳින්වීම 1
   1.1 පුනරුත්ථාපන කාර්යාංශය සතු බලතල හා කාර්යභාරය 2
   1.2 පුනරුත්ථාපන කාර්යාංශ අරමුණු හා පරමාර්ථ 3
2. සංවිධානය 4
   2.1 පාලක සභාව 4
   2.2 පාලක සභා සංයුතිය 4
   2.3 සංවිධාන ව්‍යුහය 6
      2.3.1 අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව හා පුරප්පාඩු 7
3. පුනරුත්ථාපන කාර්යයන් 9
   3.1 2023 වර්ෂයේ ක්‍රියාත්මක පුනරුත්ථාපන මධ්‍යස්ථාන 9
      3.1.1 මධ්‍යස්ථාන තුළ පුනරුත්ථාපනය කළ හැකි සංඛ්‍යාව 9
      3.1.2 2023 වර්ෂය තුළ පුනරුත්ථාපනය සඳහා යොමු කරන ලද පුනරුත්ථාපනලාභීන් සංඛ්‍යාව 10
      3.1.3 එක් එක් පුනරුත්ථාපන මධ්‍යස්ථානයන් තුළ පුනරුත්ථාපනය ලැබූ සංඛ්‍යාව 10
   3.2. පුනරුත්ථාපන ක්‍රියාකාරකම් 11
      3.2.1 "පුනරුත්ථාපනයෙන් ඔබ්බට" තේමාව යටතේ ක්‍රියාත්මක වැඩසටහන්/ දැනුවත් කිරීමේ වැඩසටහන් 15
      3.2.2 පුනරුත්ථාපනලාභීන් සඳහා වූ වෛද්‍ය සායන 17
      3.2.3 කුසලතා හා සහජ දක්ෂතාවයන් වර්ධනය කර ගැනීම සඳහා වූ වැඩසටහන් 18
      3.2.4 වෙනත් වැඩසටහන් 18
   3.3. පුනරුත්ථාපනලාභීන් සමාජගත කිරීම 20
   3.4 සමාජගත පුනරුත්ථාපනලාභීන්ගේ පසුවිපරම් කටයුතු සිදු කිරීම 21
   3.5 පුනරුත්ථාපනය වූවන්ගේ ආර්ථික, සාමාජීය හා සුභසාධක කටයුතු සම්බන්ධීකරණ කාර්යාල වෙතින් සිදු කරන ලද වැඩසටහන්/ දැනුවත් කිරීමේ වැඩසටහන් 21
4. කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් 23
5. පුනරුත්ථාපන ක්‍රියාවලිය සඳහා යටිතල පහසුකම් සැපයීම 25
   5.1 ඉදිකිරීම් කටයුතු 25
      5.1.1 ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - කන්දකාඩු 25
      5.1.2 තෘතීයික හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය - සේනපුර 26
6. පුනරුත්ථාපනලාභීන්හට ආහාර පාන ලබා දීම 26
7. ආරක්ෂාව 29
8. 2024 වර්ෂය සඳහා වන සැලසුම් 29
9. මූල්‍ය ප්‍රකාශන - 2023 33
10. විගණකාධිපති වාර්තාව - 2023 59
11. සාරාංශය 68

ඇමුණුම්

1. හැඳින්වීම



අධිකරණ නියෝග යටතේ පුනරුත්ථාපනය සඳහා යොමු කරනු ලබන නොමගගිය සටන්කරුවන් සහ අන්තරායකර ඖෂධ වලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා ස්ථාපනය කරන ලද පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය, 2023 අංක 2 දරන පනත යටතේ "පුනරුත්ථාපන කාර්යාංශය" වශයෙන් සංස්ථාපිත මණ්ඩලයක් ලෙස ස්ථාපනය කෙරිණි. මෙම පුනරුත්ථාපන කාර්යාංශය මේ වන විට අධිකරණ බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වනු ලබයි.

2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහිවූ තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපන) පිළිබඳ පනත ප්‍රකාරව ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය ඉල්ලා සිටින හෝ ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය ලබා දිය යුතු යැයි එම නීතියෙන් නියම කර ඇති ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන් සඳහා ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය ලබා දීම මෙම කාර්යාංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. ඒ සඳහා මේ වන විට මෙම කාර්යාංශය යටතේ ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - කන්දකාඩු, තෘතියික හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය - සේනපුර සහ ඒකාබද්ධතා මධ්‍යස්ථානය - වව්නියාව වශයෙන් මධ්‍යස්ථාන තුනක් (03) ක්‍රියාත්මක වේ.

සාර්ථක පුනරුත්ථාපනයකින් පසුව සමාජගත වන පුනරුත්ථාපනලාභීන්ගේ ජීවන තත්වය හා ආර්ථික තත්වය ඉහළ නැංවීමට අවශ්‍ය මඟපෙන්වීම හා සුබසාධන කටයුතු සැලසීම මෙන්ම ඔවුන් පිළිබඳව පසු රැකවරණ සිදු කිරීම අරමුණ කර ගනිමින් සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි පුනරුත්ථාපනය ලැබූවන්ගේ ආර්ථික, සාමාජීය හා සුභසාධන කටයුතු සම්බන්ධීකරණ කාර්යාල දහතුනක් (13) මෙම කාර්යාංශය යටතේ ස්ථාපිත කොට ඇත.

පුනරුත්ථාපනයෙන් පසු සමාජගත කරනු ලබන පුනරුත්ථාපනලාභීන් තවදුරටත් සමාජයෙන් ප්‍රතික්ෂේපිත පුද්ගලයෙකු නොව සමාජයට අත්‍යවශ්‍ය ආදර්ශවත් පුද්ගලයෙකු වශයෙන් පරිවර්තනය කිරීම සඳහා පුනරුත්ථාපන ක්‍රියාකරකම්වලට සමගාමීව **"පුනරුත්ථාපනයෙන් ඔබ්බට"** යන තේමාව යටතේ සුවිශේෂී වැඩසටහන් හා ක්‍රියාකාරකම් රැසක් හඳුන්වා දී ඇත.

පුනරුත්ථාපන කාලසීමාව තුළදී සිදු කරනු ලබන පුනරුත්ථාපන වැඩසටහන්, ක්‍රියාකාරකම් හා වෘත්තීය පුහුණුවීම් තුළින් ලබා දෙන දැනුම හා පුහුණුව මත පුනරුත්ථාපනයෙන් පසු සමාජගත කරනු ලබන පුද්ගලයින් ජාතික ශ්‍රම බලකායට එක්කර ගනිමින් රටේ සංවර්ධනයට ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීම මෙහි ඒකායන අපේක්ෂාවයි.

1.1 පුනරුත්ථාපන කාර්යාංශය සතු බලතල හා කාර්යභාරය

2023 අංක 2 දරන පුනරුත්ථාපන කාර්යාංශ පනත ප්‍රකාරව පුනරුත්ථාපන කාර්යාංශය සතු බලතල හා කාර්යභාරයන් පහත පරිදි වේ.

(අ) 2007 අංක 54 දරන ඖෂධවලට අබිබැහි තැනැත්තන් (ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය) පිළිබඳ පනත ප්‍රකාරව, ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය ඉල්ලා සිටින හෝ ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය ලබා දිය යුතු යැයි එම නීතියෙන් නියම කර ඇති ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන් සඳහා ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය ලබා දීම.

(ආ) අදාළ නීතියක් ප්‍රකාරව පුනරුත්ථාපනය ඉල්ලා සිටින යම් තැනැත්තකු සඳහා හෝ පුනරුත්ථාපනය ලබා දිය යුතු යැයි, එම නීතියෙන් නියම කර ඇති යම් තැනැත්තකු සඳහා පුනරුත්ථාපනය ලබාදීම.

(ඇ) සමාජ-ආර්ථික ආන්තිකකරණ අවදානම අවම කරමින් ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය ලබා ගන්නා තැනැත්තන්ගේ රැකියා සොයා ගැනීමේ හැකියාව වැඩිදියුණු කිරීම.

(ඈ) ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය ලබා ගන්නා තැනැත්තන්ගේ හැකියාවන්, ආර්ථිකය ඵලදායී ලෙස වැඩිදියුණු කිරීම සඳහා භාවිත කිරීම සඳහා සංවිධානාත්මක ආකාරයකින් යෙදවීම.

(ඉ) මානව හිමිකම් පිළිබඳ මූලික ධර්මතා සැලකිල්ලට ගනිමින් පුනරුත්ථාපනය, ප්‍රතිකාර සහ පසු සත්කාර සඳහා වන වැඩසටහන් සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් ලබා දීම.

(ඊ) ප්‍රතිකාරවලින් සහ පුනරුත්ථාපනයෙන් පසු සමාජයට ප්‍රතිසංකලනය වී ඇති තැනැත්තන් සමාලෝචනය කිරීම, අධීක්ෂණය කිරීම සහ ඔවුන්ට වෙනත් යම් සහායක් ලබා දීම.

(උ) මුදල් ලෙස හෝ ද්‍රව්‍යමය ලෙස ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාර ගැනීම. එසේ වුව ද, කාර්යාංශයට ලැබෙන සියලු විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් කාර්යාංශය විසින් මුදල් විෂයය පැවරී ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගනු ලැබිය යුතුය.

(ඌ) එය විසින් උචිත යැයි සලකනු ලබන යම් බැංකුවක යම් ගිණුමක් විවෘත කර පවත්වාගෙන යාම සහ එම ගිණුම පවත්නා අදාළ ලිඛිත නීතිවලට අනුකූලව ක්‍රියාත්මක කිරීම.

(එ) කාර්යාංශයේ අරමුදල් කළමනාකරණය කිරීම, පාලනය කිරීම, පරිපාලනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

(ඒ) කාර්යාංශයට අයත් මේ පනතේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන්නා වූ යම් මුදල් ප්‍රමාණයක් ආයෝජනය කිරීම.

(ඔ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම, තබාගැනීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම.

(ඕ) සෘජුව හෝ කාර්යාංශයේ යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු මගින් අනියම් ලෙස හෝ කාර්යාංශයේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා සහ එහි කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලුම යම් ගිවිසුම් හෝ එකඟතාවලට ඇතුළත් වීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම.

(ක) කාර්යාංශයේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම.

(ග) පුනරුත්ථාපන මධ්‍යස්ථාන පිහිටුවා පවත්වාගෙන යාම: එසේ වුව ද, ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම සඳහා පිහිටුවනු ලබන මධ්‍යස්ථාන අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලයේ විධානය යටතේ පිහිටුවා පවත්වාගෙන යනු ලැබිය යුතුය.

(ච) පුනරුත්ථාපනයට අදාළ පුහුණු වැඩසටහන් පැවැත්වීම.

(ජ) මේ පනතේ පරමාර්ථය ඉටු කර ගැනීම සඳහා හෝ මේ පනත යටතේ කාර්යාංශය වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ආනුෂංගික හෝ අවස්ථානුගත විය හැකි වෙනත් සියලු ක්‍රියා සිදු කිරීම.

1.2 කාර්යාංශ අරමුණු හා පරමාර්ථ

1.2.1 පුනරුත්ථාපන කාර්යාංශ අරමුණු

අ. පුනරුත්ථාපනලාභීන්ට අන්තරායකර ඖෂධ භාවිතයෙන් ඈත්වීම සඳහා සහාය වීම හා මනෝ විද්‍යාත්මක ප්‍රතිකාර ක්‍රම තුළින් චර්යාත්මක වෙනසකට භාජනය කිරීම.

ආ. ඔවුන්ගේ ජීවන වටපිටාව හා වාතාවරණය වෙනස් කිරීම තුළින් අන්තරායකර ඖෂධ වලට ඇබ්බැහිවීමෙන් මොවුන් මුදවා ගැනීම.

ඇ. සමාජගත වීමෙන් පසු රැකියා අවස්ථාවන් උදාකර ගැනීමට හැකිවන පරිදි වෘත්තීය දැනුම ලබාදීම සඳහා මග පෙන්වීම.

ඈ. පවුල් සංස්ථාව ශක්තිමත් කිරීම, එහි වැදගත්කම, ද්විපාර්ශවීය වැදගත්කම අවබෝධ කර දීම හා පවුල් සංස්ථාව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන්නා වූ ආර්ථික, සමාජීය හා සුභ සාධන කටයුතු නගා සිටුවීම.

1.2.2 පරමාර්ථ

සමාජ, ආර්ථික ප්‍රමිතීන් සකස් කිරීම මාර්ගයෙන්, සඵලදායී ප්‍රතිසංකලනය සහ ප්‍රතිසන්ධානය සහතික කිරීම පිණිස ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන් හෝ ප්‍රතිකාර සහ විවිධ ප්‍රතිකාර ක්‍රම යොදා ගැනීම ඇතුළත් විය හැකි පුනරුත්ථාපනය අවශ්‍ය තැනැත්තකු ලෙස නීතියෙන් හඳුනාගනු ලැබිය හැකි වෙනත් යම් තැනැත්තකු පුනරුත්ථාපනය කිරීම මෙහි පරමාර්ථ වේ.

2. සංවිධානය

2.1 පාලක සභාව

2023 අංක 02 දරන පුනරුත්ථාපන කාර්යාංශ පනතේ 5 වන වගන්තිය ප්‍රකාරව කාර්යාංශයේ කටයුතු පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ පාලනය කිරීමට පාලක සභාව පත් කර ඇත. පුනරුත්ථාපන කාර්යාංශ පනතේ 6 වන වගන්තියේ (අ) හා (ආ) ප්‍රකාරව පත් කරන ලද සාමාජිකයන් මඟින් කාර්යාංශයේ බලතල හා කාර්යයන් කටයුතු පාලනය කිරීම, කළමනාකරණය කිරීම සඳහා පාලක සභාවක් පත් කිරීම සිදු විය. කාර්යාංශයේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා සභාව විසින් පිරිනමා ඇති, පවරා ඇති හෝ පනවා ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සිදු කරනු ලැබේ. මෙහිදී අමාත්‍යවරයා විසින් පත් කළ සාමාජිකයන් පස්දෙනා අතුරින් එක් අයකු සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබේ.

2.2 පාලක සභා සංයුතිය

2023 අංක 02 දරන පුනරුත්ථාපන කාර්යාංශ පනතේ 6 වන වගන්තිය (අ) ප්‍රකාරව පත් කරනු ලබන කාර්යාංශ පාලක සභාවේ සංයුතිය පහත පරිදි වේ.

(i) අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලයේ නියෝජිතයකු;

(ii) ආරක්ෂක විෂයය පැවරී ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන ඔහුගේ නියෝජිතයකු;

(iii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ පුනරුත්ථාපන කාර්යාංශය පැවරී ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන ඔහුගේ නියෝජිතයකු;

(iv) සෞඛ්‍ය විෂයය පැවරී ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන ඔහුගේ නියෝජිතයකු;

(v) අධ්‍යාපන විෂයය පැවරී ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන ඔහුගේ නියෝජිතයකු;

(vi) පොලිස්පතිවරයා හෝ නියෝජ්‍ය පොලිස්පතිවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන ඔහුගේ නියෝජිතයකු;

* භාණ්ඩාගාර නියෝජිතයෙක් නිරීක්ෂක ලෙස සහභාගී වේ.

2023 අංක 02 දරන පුනරුත්ථාපන කාර්යාංශ පනතේ 6 වන වගන්තිය (ආ) ප්‍රකාරව අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන (මෙහි මින් මතු ''පත් කරන ලද සාමාජිකයන්" යනුවෙන් හඳුන්වන්නන්) කාර්යාංශ පාලක සභාවේ සංයුතිය පහත පරිදි වේ.

(i) ශාස්ත්‍රීය සහ වෘත්තීය සුදුසුකම් සහිත පුනරුත්ථාපන ක්ෂේත්‍රයේ පළපුරුද්ද ඇති තැනැත්තන් දෙදෙනකු;


(ii) ශාස්ත්‍රීය සහ වෘත්තීය සුදුසුකම් සහිත සමාජ සංකලනය ක්ෂේත්‍රයේ පළපුරුද්ද ඇති තැනැත්තන් දෙදෙනකු;

(iii) ශාස්ත්‍රීය සහ වෘත්තීය සුදුසුකම් සහිත නීතිය හා යථා පැවැත්ම ක්ෂේත්‍රයේ පළපුරුද්ද ඇති තැනැත්තකු, සමන්විත විය යුතු ය.

පුනරුත්ථාපන කාර්යාංශ පාලක සභා සභාපති හා සාමාජිකයන්ගේ විස්තරය

පත් කිරීමේ ස්වභාවය	නම	දැනට දරනු ලබන තනතුර/විශ්‍රාම යාමට පෙර දරන ලද තනතුර/ලිපිනය
පාලක සභා සභාපති	ජනාධිපති නීතිඥ උදය රොහාන් ද සිල්වා මහතා	සභාපති, පුනරුත්ථාපන කාර්යාංශය, නො. 462/2, කඩුවෙල පාර, ගනහේන, බත්තරමුල්ල
පත් කළ සාමාජික	සම්මානිත මහාචාර්ය ආර්. කේ. ආරියරත්න මහතා	හිටපු උප කුලපති, (විශ්‍රාමික) සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය
පත් කළ සාමාජික	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මොහොමඩ් මුජිතබා මොහොමඩ් නජීම් මහතා	සත්ව විද්‍යා හා පාරිසරික කළමනාකරණ අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, දළුගම, කැලණිය.
පත් කළ සාමාජික	සමන් දේවප්‍රිය උඩවත්ත මහතා	අතිරේක ලේකම්, (විශ්‍රාමික) පාලන, සමාජ සවිබල ගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය
පත් කළ සාමාජික	ඉන්දික අභියුරු ප්‍රේමතිලක විජේවර්ධන මහතා	නීතිඥ,
නිල බලයෙන් පත් කළ සාමාජික	ඊ. ඒ. ජේ. එදිරිසිංහ මහතා	අතිරේක ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.
නිල බලයෙන් පත් කළ සාමාජික	සී. සුරේෂ්වරන් මහත්මිය	අධ්‍යක්ෂ ජනරාල්(සැලසුම්), අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය, නො. 19, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10
නිල බලයෙන් පත් කළ සාමාජික	වෛද්‍ය ටී. එල්. සී. සෝමතුංග මහත්මිය	අතිරේක ලේකම්, (මහජන සෞඛ්‍ය සේවා) සෞඛ්‍ය අමාත්‍යාංශය, සුවසිරිපාය, අංක 385, බද්දේගම විමලවංශ තෙර මාවත, කොළඹ 10.
නිල බලයෙන් පත් කළ සාමාජික	දේවිකා ලියනගේ මහත්මිය	අතිරේක ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය "ඉසුරු පාය", බත්තරමුල්ල.
නිල බලයෙන් පත් කළ සාමාජික	ශාක්‍ය නානායක්කාර මහතා	සභාපති, අන්තරාදායක ඖෂධ පාලක ජාතික මණ්ඩලය නො. 388, කෝට්ටේ පාර, රාජගිරිය.
නිල බලයෙන් පත් කළ සාමාජික	කේ. වී. ඩී. ඒ. ජේ. කරවිට මහතා	ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, (පුහුණු හා උසස් පුහුණු) ශ්‍රී ලංකා පොලීසිය, කොළඹ 01.
නිරීක්ෂක	කේ. එස්. දයාරත්න මහත්මිය	අධ්‍යක්ෂ, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මුදල් අමාත්‍යාංශය කොළඹ 01.

2.3 සංවිධාන ව්‍යුහය



පුනරුත්ථාපන කාර්යාංශය - සංවිධාන ව්‍යුහය (මුළු.262)

* Chairmen and council members are not included in the proposed staff summary.

2.3.1 අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව හා පුරප්පාඩු

අ/අ	වැටුප් තලය	තනතුර	අනුමත තනතුරු සංඛ්‍යාව	ඇතුළත් සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සේවක සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම					
1	HM-2-1	පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්	1	1	0
2	HM-1-3	අතිරේක පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්	1		1
3	HM-1-2	කොමසාරිස් - පුනරුත්ථාපන	1		1
4	HM-1-2	කොමසාරිස් - පාලන	1		1
5	MM-1-1	සහකාර/නියෝජ්‍ය කොමසාරිස් - පාලන	1		1
6		සහකාර/නියෝජ්‍ය කොමසාරිස් - ප්‍රසම්පාදන	1		1
7		සහකාර/නියෝජ්‍ය කොමසාරිස් - පුනරුත්ථාපන	1		1
8		පුනරුත්ථාපන අධිකාරි	3		3
9		නීති නිලධාරි	1		1
10		ගණකාධිකාරි	1	1	0
11		අභ්‍යන්තර විගණක	1	1	0
තෘතියික මට්ටම					
12	JM-1-1	සහකාර පුනරුත්ථාපන අධිකාරි	6		6
13		අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්	1		1
14		පරිපාලන නිලධාරි	1	1	0
15		සැපයුම් නිලධාරි	2		2
16	MA-5-2	පුනරුත්ථාපන නිලධාරී	13		13
17	MA-4	භාෂා පරිවර්තක	1	1	0
18		උපදේශන නිලධාරී (පුනරුත්ථාපන)	22	4	18
ද්විතීයික මට්ටම					
19	MA-2-2	උපදේශන සහකාර - පුනරුත්ථාපන	37		37
20		ශාරීරික අභ්‍යාස උපදේශක	10		10
21		සෞඛ්‍ය සහකාර	5		5
22	MA-2-1	තොරතුරු තාක්ෂණික සහකාර	2	3	0
23	MA-1-1	කළමනාකරණ සහකාර	67	20	47
24		කළමනාකරණ සහකාර ⋆	7	7	0

අ/අ	වැටුප් තලය	තනතුර	අනුමත තනතුරු සංඛ්‍යාව	ඇතුළත් සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සේවක සංඛ්‍යාව
ප්‍රාථමික මට්ටම					
25	PL-3	රියදුරු	36	4	32
26		ජල නල කාර්මික/ ජල මෝටර් ක්‍රියාකරු	3		3
27		විදුලි කාර්මික/ ජනක යන්ත්‍ර ක්‍රියාකරු	3		3
28	PL -2	අරක්කැමි	6	2	4
29		අරක්කැමි ★	4	4	0
30		කරණුවැමි	1		1
31		රජක සේවක	1	1	0
32	PL - 1	භෝජනාගාර සේවක	1	1	0
33		කාර්යාල කාර්ය සහයක	7	5	2
34		කාර්යාල කාර්ය සහයක ★	1	1	0
35		කම්කරු	7	7	0
36		සනීපාරක්ෂක කම්කරු	4	4	0
37		සනීපාරක්ෂක කම්කරු ★	1	1	0
එකතුව			**262**	**69**	**194**

පුනරුත්ථාපන කාර්යාංශ සිවිල් කාර්ය මණ්ඩලය සඳහා අනුමත තනතුරු 262 ක් සඳහා DMS/1869 හා 2023.06.27 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය මඟින් අනුමැතිය ලබා දී ඇත. අනුමත තනතුරු සඳහා එහි තනතුරු නාම හා වැටුප් කේතවලට අදාළ බඳවා ගැනීමේ පරිපාටි සකස් කර 2023.10.23 කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කර ඇත.

පුනරුත්ථාපන ක්‍රියාදාමය සාර්ථකව කරගෙන යාම සඳහා අත්‍යවශ්‍ය තනතුරු වෙනුවෙන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලද කාර්ය මණ්ඩලයක් යොදවා ඇති අතර, සේවා අවශ්‍යතාවය අනුව ඔවුන්ගේ සේවා කාලය වසරින් වසර දීර්ඝ කිරීම සිදු කරනු ලබයි. ඒ අනුව අංක DMS/1148 - II හා 2023.03.03 දිනැති හා DMS/1869 හා 2023.07.27 යන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය මඟින් ඔවුන්ගේ සේවා කාලය 2023.01.01 දින සිට පුනරුත්ථාපන කාර්යාංශය වෙනුවෙන් අනුමත තනතුරු සඳහා විධිමත් පරිදි නව බඳවා ගැනීම් සිදු කරන දිනය හෝ 2023.12.31 යන දින දෙකෙන් පළමුව එළඹෙන දිනය දක්වා දීර්ඝ කිරීමට අනුමැතිය ලබා දී ඇත.

තවද කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමත කර ඇති තනතුරු සිවිල් නිලධාරීන් විසින් දැරිය යුතු තනතුරු වුවත් එම නිලධාරීන්ගේ පුරප්පාඩු හේතුවෙන් මේවන විට එම තනතුරු ත්‍රිවිධ හමුදා නිලධාරීන් හා සෙසු නිල සාමාජිකයින් යොදවා ගනිමින් ආවරණය කර ගැනීමට සිදු වී ඇත. (ඇමුණුම "ආ" යටතේ ඉදිරිපත් කෙරේ.)

මීට අමතරව ජනාධිපති ලේකම් කාර්යාලයේ උපදෙස් හා අනුමැතිය මත අත්‍යවශ්‍ය තනතුරු ද ඇති කර ඇති අතර එම තනතුරු සඳහා 05 දෙනෙකුගෙන් යුත් විශ්‍රාමික හමුදා කාර්ය මණ්ඩලයක් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන ඇත. මෙම තනතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙහි අනුමැතිය සහිතව දරන්නාට පොද්ගලික වන සේ අනුමත කර ඇත. තවද ඔවුන් හට වැටුප් හා දීමනා ගෙවීම් නිර්ණය කිරීම 3/2018 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනය අනුව කටයුතු සිදු කර ඇත.

3. පුනරුත්ථාපන කාර්යයන්

3.1 2023 වර්ෂයේ ක්‍රියාත්මක පුනරුත්ථාපන මධ්‍යස්ථාන

අන්තරායකර ඖෂධවලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා පුනරුත්ථාපන කාර්යාංශය යටතේ මධ්‍යස්ථාන තුනක් (03) ස්ථාපිත කොට ඇති අතර, එම මධ්‍යස්ථාන පහත පරිදි වේ.

1. ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - කන්දකාඩු
2. තෘතියික හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය- සේනපුර
3. ඒකාබද්ධතා මධ්‍යස්ථානය - වව්නියාව



1. ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - කන්දකාඩු



2. තෘතියික හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය- සේනපුර



3. ඒකාබද්ධතා මධ්‍යස්ථානය - වව්නියාව

3.1.1 මධ්‍යස්ථාන තුළ පුනරුත්ථාපනය කළ හැකි සංඛ්‍යාව

ඉහත පුනරුත්ථාපන මධ්‍යස්ථානයන්හි එකවර පුනරුත්ථාපනය කළ හැකි නේවාසික පුනරුත්ථාපනලාභීන් සංඛ්‍යාව

අ/අ	පුනරුත්ථාපන මධ්‍යස්ථානය	පුනරුත්ථාපනය කළ හැකි නේවාසික පුනරුත්ථාපනලාභීන් සංඛ්‍යාව
1	ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන - කන්දකාඩු	500
2	තෘතියික හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය - සේනපුර	500
3	ඒකාබද්ධතා මධ්‍යස්ථානය - වව්නියාව	120

මෙම පුනරුත්ථාපන මධ්‍යස්ථාන මඟින් අධිකරණ නියෝගයන් යටතේ යොමු කරනු ලබන පුනරුත්ථාපනලාභීන් පුනරුත්ථාපනය කිරීම සිදු වේ.

3.1.2 2023 වර්ෂය තුළ පුනරුත්ථාපනය සඳහා යොමු කරන ලද පුනරුත්ථාපනලාභීන් සංඛ්‍යාව

2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා අධිකරණ නියෝග යටතේ පුනරුත්ථාපනය සඳහා මෙම කාර්යාංශය වෙත යොමු කරන ලද පුනරුත්ථාපනලාභීන්ගේ සංඛ්‍යාව පහත වගුව මඟින් දක්වා ඇත.

වර්ෂය	මාසය	පුනරුත්ථාපනයට යොමු කළ සංඛ්‍යාව
2023	ජනවාරි	84
	පෙබරවාරි	85
	මාර්තු	90
	අප්‍රේල්	105
	මැයි	84
	ජූනි	118
	ජූලි	149
	අගෝස්තු	260
	සැප්තැම්බර්	212
	ඔක්තෝම්බර්	259
	නොවැම්බර්	165
	දෙසැම්බර්	214
	එකතුව	**1825**

3.1.3 මෙම කාර්යාංශය යටතේ ස්ථාපිත එක් එක් පුනරුත්ථාපන මධ්‍යස්ථානයන් තුළ 2023.12.31 දිනට නේවාසිකව පුනරුත්ථාපනය වූ පුනරුත්ථාපනලාභීන්ගේ සංඛ්‍යාත්මක දත්තයන් පහත සඳහන් පරිදි දැක්විය හැක.

වර්ෂය	පුනරුත්ථාපන මධ්‍යස්ථානය	පුනරුත්ථාපනලාභීන් සංඛ්‍යාව
2023	ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - කන්දකාඩු	399
	තෘතීයික හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය - සේනපුර	482
	ඒකාබද්ධතා මධ්‍යස්ථානය - වව්නියාව	113
	එකතුව	**994**

3.2. පුනරුත්ථාපන ක්‍රියාකාරකම්

මාස 06 ක් පුනරුත්ථාපන කාලසීමාවකට යොමු කරනු ලබන පුනරුත්ථාපනලාභීන්ට අවශ්‍ය මූලික පහසුකම් සපුරාලමින් විධිමත් කාල සටහනකට අනුව ශ්‍රී ලංකාවේ පිළිගත් ව්‍යාත්තීයමය සම්පත්දායකයන්ගේ සහභාගිත්වයෙන් කායික, මානසික, සෞඛ්‍ය හා ආධ්‍යාත්මික වැඩසටහන් මෙම කාල සීමාව තුල සිදු කර ඇත. එම වැඩසටහන් පැවැත්වීම තුළින් විවිධ වූ කායික හා මානසික ව්‍යාකූලතාවයන්ගෙන් පෙළුණු පුනරුත්ථාපනලාභින්ගේ කායික හා මානසික තත්ත්වය ඉහළ නංවාලීමට මෙන්ම සුබවාදී ආකල්ප හා ධනාත්මක චින්තනය ඇති කිරීමට ඉවහල් වී ඇත. පවත්වනු ලැබූ වැඩසටහන් හා ඊට අදාළ දෘෂ්‍යමය දත්ත පහතින් දක්වා ඇත.

අ/අ	විස්තරය	සිදු කළ වැඩසටහන් සංඛ්‍යාව
1	මානසික හා කායික සංවර්ධන වැඩසටහන් (ආධ්‍යාත්මික, උපදේශනය, යෝගා හා විවිධ චිකිත්සක)	330
2	අධ්‍යාපනික වැඩසටහන් (සිංහල, ඉංග්‍රීසි හා දෙමළ භාෂා තාක්ෂණික දැනුම හා විශේෂ දින සැමරුම්)	97
3	ආගමික වැඩසටහන්	51
4	ක්‍රීඩා වැඩසටහන්	12
5	නායකත්ව හා පෞරුෂ සංවර්ධන වැඩසටහන්	17
6	ස්වයං රැකියා පුහුණු වැඩසටහන්	5
7	සෞන්දර්යාත්මක වැඩසටහන්	46




පුනරුත්ථාපනලාභීන් මානසික හා කායික සංවර්ධන වැඩසටහන් සඳහා සහභාගී වීම




පුනරුත්ථාපනලාභීන් අධ්‍යාපනික වැඩසටහන් සඳහා සහභාගී වීම.





පුනරුත්ථාපනලාභීන් ආගමික වැඩසටහන් සඳහා සහභාගී වීම.





පුනරුත්ථාපනලාභීන් ක්‍රීඩා වැඩසටහන් සඳහා සහභාගී වීම.





පුනරුත්ථාපනලාභීන් සෞන්දර්යාත්මක වැඩසටහන් සඳහා සහභාගී වීම.

ඉහත වැඩසටහන්වලට අමතරව පුනරුත්ථාපන කාලසීමාව සාර්ථකව නිමවා සමාජගත වීමෙන් පසු තම ජීවනෝපායන් සලසා ගැනීම සඳහා අවශ්‍ය දැනුම ලබාදීමේ අරමුණින් වෘත්තීය පුහුණු පාඨමාලා 11 ක් පහත සඳහන් අයුරින් තෘතීයික හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය - සේනපුර තුළ සිදු කර ඇත.

අ/අ	පාඨමාලාවේ නම	2023 වර්ෂය තුළ පවත්වනු ලැබූ පාඨමාලා සංඛ්‍යාව
1	පරිගණක පාඨමාලාව (මූලික)	3
2	පරිගණක (දෘඩාංග) පාඨමාලාව	3
3	භෝජනාගාර සහයක පාඨමාලාව	3
4	කොණ්ඩා සැකසුම් පාඨමාලාව	3
5	බේකරි නිෂ්පාදන පාඨමාලාව	3
6	ජලනල කාර්මික පාඨමාලාව	3
7	පෙදරේරු පාඨමාලාව	3
8	වඩු කාර්මික පාඨමාලාව	3
9	ඇලුමිනියම් පිරිසැකසුම් පාඨමාලාව	1
10	බැකෝ යන්ත්‍ර මෙහෙයුම් පාඨමාලාව	4
11	මැණික් කැපීමේ හා ඔප දැමීමේ පාඨමාලාව	2



කොණ්ඩා සැකසුම් පාඨමාලාව



මැණික් කැපීමේ හා ඔප දැමීමේ පාඨමාලාව



බැකෝ යන්ත්‍ර මෙහෙයුම් පාඨමාලාව



බේකරි නිෂ්පාදන පාඨමාලාව



පරිගණක පාඨමාලාව



භෝජනාගාර සහයක පාඨමාලාව



ඇලුමිනියම් පිරිසැකසුම් පාඨමාලාව



වඩු කාර්මික පාඨමාලාව





පෙදරේරු පාඨමාලාව

3.2.1. "පුනරුත්ථාපනයෙන් ඔබ්බට" යන තේමාව යටතේ ක්‍රියාත්මක දැනුවත් කිරීමේ වැඩසටහන්

පුනරුත්ථාපනයෙන් පසු සමාජගත කරනු ලබන පුනරුත්ථාපනලාභීන් තවදුරටත් ප්‍රතික්ෂේපිත පුද්ගලයින් නොව සමාජයට අත්‍යවශ්‍ය පුද්ගලයින් බවට පත් කිරීමේ අරමුණින් **"පුනරුත්ථාපනයෙන් ඔබ්බට"** යන තේමාව යටතේ 2023 වර්ෂයේ සිට ක්‍රියාත්මක වැඩසටහන්/ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි වේ.

- ජීවිතාරක්ෂක ක්‍රමවේද සබැඳිව පාඨමාලා පැවැත්වීම.
- මූලික ආපදා කළමනාකරණ ශිල්පක්‍රම සබැඳිව දැනුවත් කිරීම.
- ප්‍රථමාධාර ලබා දීම සබැඳිව දැනුවත් කිරීම.
- යම් කිසි ස්ථානයක බෝම්බයක් ඇති බවට තොරතුරු ලද අවස්ථාවකදී සාමාන්‍ය පුරවැසියෙකු වශයෙන් ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව දැනුවත් කිරීම.
- හදිසි ගිනි ගැනීම් තත්ත්වයකදී ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව දැනුවත් කිරීම.
- ජංගම දුරකථන භාවිතය හේතුවෙන් ඇති වන අනිසි ප්‍රතිවිපාක හා වගකිව යුතු පුරවැසියන් වශයෙන් සමාජ මාධ්‍ය සහ අන්තර්ජාලය භාවිතා කළ යුතු ආකාරය පිළිබඳව දැනුවත් කිරීම.
- වනාන්තර ආරක්ෂා කිරීමේ වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීම.
- පරිසරය සුරැකීමේ වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීම.
- ජල සම්පත සුරැකීමේ වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීම.
- විදුලි බලය අරපිරිමැස්මෙන් භාවිතා කිරීමේ වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීම.
- ශ්‍රී ලංකාවේ ඓතිහාසික ස්ථාන හා ඒවායේ වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීම.
- යහපත් ළමා පරපුරක් සකස් කරන්නේ කෙසේද යන්න දැනුවත් කිරීම.
- යහපත් පවුල් ජීවිතයක් ගත කරන්නේ කෙසේද යන්න දැනුවත් කිරීම.
- රටේ පුරවැසියෙකු වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විශේෂයෙන් දැනගත යුතු කරුණු පිළිබඳව දැනුවත් කිරීම.
- වෙරළ සංරක්ෂණ හා මුහුදු සම්පත් රැක ගැනීමේ වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීම.
- ප්ලාස්ටික් හා පොලිතින් භාවිතයෙන් මිනිස් ජීවිතයට හා පරිසරයට සිදුවන හානිය පිළිබඳ දැනුවත් කිරීම.
- කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- තෝරාගත් සහ සිය කැමැත්තෙන් ඉදිරිපත් වන්නන් හට ත්‍රාසජනක ක්‍රියාකාරකම් පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- ගෙවතු වගාව පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- සුදුසුකම් සපුරා ඇති පුනරුත්ථාපනලාභීන් හට රියදුරු බලපත්‍ර ලබා දීම හා තෝරා ගත් අයවළුන් හට විදේශ ගමන් බලපත්‍ර ලබා දීම.
- ජාතික හැඳුනුම්පත් නොමැති සියලු දෙනා හට ජාතික හැඳුනුම්පත් ලබා දීම.
- කොසු ඉදල් නිෂ්පාදන වැඩසටහන.
- පුනරුත්ථාපනලාභීන් සඳහා නීති ආධාර ලබා දීමේ වැඩසටහන.
- ශ්‍රී ලංකාවේ විවිධ ජාතීන් අතර සාමයෙන් සමගියෙන් හා සහජීවනයෙන් ජීවත්වීමේ වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීම.





ප්‍රථමාධාර ලබා දීම සබැඳිව පුනරුත්ථාපනලාභීන් දැනුවත් කිරීමේ වැඩසටහන්



හදිසි ගිනි ගැනීම් තත්ත්වයකදී ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන



පරිසරය සුරැකීමේ වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන



ජීවිතාරක්ෂක ක්‍රමවේද පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන



යහපත් පවුල් ජීවිතයක් ගත කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන

3.2.2 පුනරුත්ථාපනලාභීන් සඳහා වූ වෛද්‍ය සායන

නේවාසිකව පුනරුත්ථාපනය වන පුනරුත්ථාපනලාභීන්ගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව නිරතුරු විශේෂ අවධානයක් යොමු කරන අතර, අවශ්‍යතාවය මත ඔවුන්ට අවැසි වෛද්‍ය ප්‍රතිකාර ලබාදීම හෝ හදිසි රෝගී තත්ත්වයන් හමුවේ රෝහල් ගත කිරීම් ද සිදු කර ඇත. මීට අමතරව කායික හා මානසික වෛද්‍ය ප්‍රතිකාර සඳහා සුදුසු විශේෂඥ වෛද්‍යවරුන් වෙත යොමු කිරීමත් වෙනත් කායික රෝග පිළිබඳ දැනුවත් කිරීමට හා වෛද්‍ය සායන පැවැත්වීමත් මධ්‍යස්ථානයන් තුළ සිදු කර ඇත. ඒ යටතේ 2023 වර්ෂය තුල පහත සඳහන් වෛද්‍ය සායන හා දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කර ඇති අතර, අවශ්‍යතාවය මත වෛද්‍ය පහසුකම් ලබාදීමේ කටයුතු ද සිදු කර ඇත.

- පුනරුත්ථාපනලාභීන් හට සතියකට වරක් ආයුර්වේද වෛද්‍යවරයෙකුගේ අධීක්ෂණය යටතේ ප්‍රතිකාර ලබා දීම.
- පිළිකා රෝගයෙන් මිදීම සඳහා පුනරුත්ථාපනලාභීන් දැනුවත් කිරීම.
- බෝ නොවන රෝග සබැඳිව සහ බෝ නොවන රෝගවලින් මිදීම සඳහා ජීවිතය සකසා ගත යුතු අයුරු පිළිබඳව දැනුවත් කිරීම.
- ලිංගාශ්‍රිත රෝග හා ඒඩිස් රෝගය සබැඳිව පුනරුත්ථාපනලාභීන් දැනුවත් කිරීම.
- දේශීය පෝෂ්‍යදායී ආහාර පාන ලබා ගැනීම පිළිබඳව දැනුවත් කිරීම.
- අක්ෂි සායන පැවැත්වීම.
- දන්ත වෛද්‍ය සායනය හා දත් සුරැකීම පිළිබඳ දැනුවත් කිරීම.
- වකුගඩු රෝග වළක්වා ගැනීම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන්
- දියවැඩියා රෝගයෙන් වැළකීම සඳහා දැනුවත් කිරීම
- උගුර කන නාසය පිළිබඳ වෛද්‍ය සායන හා දැනුවත් කිරීමේ වැඩසටහන් සහ සායන පැවැත්වීම.
- හෘද පුනර්ජීවන (Restart a Heart) වැඩසටහන් පැවැත්වීම.
- ඩෙංගු මර්දනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- සමේ රෝග පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.



පුනරුත්ථාපනලාභීන් වෛද්‍ය සායන හා දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සහභාගී වීම

3.2.3. කුසලතා හා සහජ දක්ෂතාවයන් වර්ධනය කර ගැනීම සඳහා වූ වැඩසටහන්

පුනරුත්ථාපනය ලබන කාලය තුළ පුනරුත්ථාපනලාභීන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහාත් ඔවුන්ගේ විවේකී කාලය ඵලදායීව ගත කිරීම සඳහාත් සුදුසු පියවරයන් ලෙස සෑම මධ්‍යස්ථානයකම පුස්තකාල පහසුකම් හා පුවත්පත් කියවීම/රූපවාහිනී නැරඹීමේ පහසුකම් සලසා දී ඇත. මෙමගින් දෛනිකව රට තුළ සහ ලොව වටා කාලීන පුවත් දැනගැනීමට මෙන්ම විනෝදය සඳහා තෝරාගත් චිත්‍රපට/ වැඩසටහන් නැරඹීමේ අවස්ථාව ද පුනරුත්ථාපනලාභීන් වෙත ලබාදී ඇත. තවද දෛනික කාල සටහනකට අනුව ක්‍රියාත්මක පුනරුත්ථාපන වැඩසටහන තුළ ක්‍රිකට්, පා පන්දු, අත් පන්දු, දැල් පන්දු, කැරම්, දාම්, චෙස් හා බැට්මින්ටන් ආදී ක්‍රීඩා උපකරණ ද ගායන/වාදන හැකියාවන්ගෙන් හෙබි පුනරුත්ථාපනලාභීන් සඳහා අවැසි සංගීත උපකරණ ද ඊට අවශ්‍ය පහසුකම් ද මධ්‍යස්ථානයන් තුළ සපයා ඇත. මීට අමතරව පුනරුත්ථාපනලාභීන්ගේ කායික හා මානසික සුවතාවයට අවැසි ව්‍යායාම් සඳහා ගෘහස්ථ/ එළිමහන් කායවර්ධන මධ්‍යස්ථාන පිහිටුවා ඇති අතර කායවර්ධන උපදේශකයන්ගේ සුපරීක්ෂාව යටතේ පුනරුත්ථාපනලාභීන් හට සුදුසු කායවර්ධන වැඩසටහන් සිදු කිරීමට ද මෙම මධ්‍යස්ථාන තුළ පහසුකම් සලසා දී ඇත. මෙහිදී පුනරුත්ථාපනලාභීන්ගේ කුසලතා හා සහජ දක්ෂතාවයන් වර්ධනය කර ගැනීමට මධ්‍යස්ථාන තුළ 2023 වර්ෂය තුළ පහත සඳහන් වැඩසටහන් පවත්වා ඇත.

- මධ්‍යස්ථානයේ හොඳම කායවර්ධන ශූරයා තේරීම (Best Body Builder)
- මධ්‍යස්ථානයේ හොඳම ශක්තිවන්ත අභ්‍යාසලාභියා තේරීම (Fittest Rehabilitee)
- මධ්‍යස්ථානයේ ගායන තරුව තේරීම (Singing Star)
- මධ්‍යස්ථානයේ නර්තන තරුව තේරීම (Dancing Star)
- මධ්‍යස්ථානයේ හොඳම නිවේදකයා තේරීම (Best Compere)





වැඩසටහන් සඳහා සහභාගී වන පුනරුත්ථාපනලාභීන්

3.2.4 වෙනත් වැඩසටහන්

පුනරුත්ථාපනලාභීන්ගේ කායික හා මානසික සෞඛ්‍ය වර්ධනය සඳහා අවැසි කෘෂි චිකිත්සාවක් ලෙස හා ඔවුනට සමාජගත වීමෙන් පසු තම ජීවනෝපාය වැඩිදියුණු කිරීමට සුදුසු වෘත්තීය පුහුණුවක් මඟින් ඵලදායී ස්වයං රැකියාවක නිරත කරවීමේ අරමුණු පෙරදැරිව පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

අ. බඩ ඉරිගු වගා කිරීමේ ව්‍යාපෘතිය.
ආ. කාබනික පොහොර නිෂ්පාදනය කිරීම.
ඇ. සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීම.

ඇ. බඩ ඉරිගු වගා කිරීමේ ව්‍යාපෘතිය.

පුනරුත්ථාපනයට යොමු කරවන පුනරුත්ථාපනලාභීන්ගේ ශ්‍රමය රටෙහි ජාතික සංවර්ධනයට යොදා ගැනීමේ අරමුණින් හා කෘෂි චිකිත්සාවක් ලෙස ද, වත්මන් ආහාර අවශ්‍යතාවයට පිළියමක් සහ සත්ත්ව ආහාර ආනයනය සීමා කර දේශීයව නිෂ්පාදනය කර ගැනීමේ එක් පියවරක් ලෙස බඩ ඉරිගු වගා කිරීමේ ව්‍යාපෘතියක් ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලයේ මැදිහත්කාරත්වයෙන් සහ සිලෝන් බිස්කට් සමාගමේ මූල්‍ය අනුග්‍රහය ඇතිව ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - කන්දකාඩු හි දී ආරම්භ කර ඇත.




ඈ. කාබනික පොහොර නිෂ්පාදනය කිරීම.

පුනරුත්ථාපන මධ්‍යස්ථාන තුළ ඉවතලන කුණු රොඩු, ඉවතලන ඉඳුල් හා ශාක කොටස් යන අපද්‍රව්‍ය උපයෝගි කොට ගෙන පුනරුත්ථාපනලාභීන් හට කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් තෘතියික හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය - සේනපුර හි දී දියත් කර ඇත. මෙම වැඩසටහන පැවැත්වීමේ මූලික අරමුණු පහත සඳහන් වේ.

1.) ප්‍රමිතියෙන් යුතු කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය පිළිබඳව දැනුමක් ලබා දීම.
2.) කාබනික පොහොර නිෂ්පාදනයේ වැදගත්කම
3.) අපද්‍රව්‍ය කළමනාකරණය මඟින් පරිසර දූෂණය අවම කිරීම.
4.) ස්වයං රැකියා ව්‍යාප්ත කිරීම.




ඈ. සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදන කිරීම.

පුනරුත්ථාපනලාභීන් ස්වයං රැකියාවන්ට යොමු කිරීම සඳහා බ්ලොක්ගල් නිෂ්පාදනය කිරීමට අවශ්‍ය දැනුම හා පුහුණුව ලබා දීමේ අරමුණින් සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීමේ වැඩසටහන තෘතියික හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය - සේනපුර දී දියත් කර ඇත.





3.3. පුනරුත්ථාපනලාභීන් සමාජගත කිරීම

මාස 06ක පුනරුත්ථාපන කාල සීමාවක් සඳහා යොමු කළ පුනරුත්ථාපනලාභීන් පුනරුත්ථාපන ක්‍රියාවලිය අවසානයේදී හෝ අධිකරණ නියෝගයේ සඳහන් දිනට සමාජගත කිරීම සිදු කර ඇත. ඒ අනුව 2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා වර්ෂය තුළ පුනරුත්ථාපනයෙන් පසු නැවත සමාජගත කරන ලද පුනරුත්ථාපනලාභීන් සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.

මාසය	සමාජගත කළ සංඛ්‍යාව
ජනවාරි	47
පෙබරවාරි	57
මාර්තු	63
අප්‍රේල්	107
මැයි	102
ජුනි	59
ජූලි	93
අගෝස්තු	57
සැප්තැම්බර්	109
ඔක්තෝම්බර්	63
නොවැම්බර්	84
දෙසැම්බර්	85
එකතුව	**926**

3.4 සමාජගත පුනරුත්ථාපනලාභීන්ගේ පසුවිපරම් කටයුතු සිදු කිරීම

පුනරුත්ථාපන කාලය අවසන් වූ පසු පුනරුත්ථාපනලාභීන් සමාජගත කිරීමෙන් අනතුරුව ඔවුන්ගේ ජීවන තත්ත්වය ආර්ථිකමය හා සමාජීය වශයෙන් ඉහළ නැංවීම සඳහා අවැසි සුභසාධන කටයුතු සිදු කිරීමට මෙම කාර්යාංශය යටතේ ස්ථාපිත දිවයින පුරා ව්‍යාප්ත පුනරුත්ථාපනය වූවන්ගේ ආර්ථික, සමාජයීය, සුභසාධන කටයුතු සම්බන්ධීකරණ කාර්යාල 13 ක් මගින් සිදු කරනු ලබයි. ඒ අනුව අන්තරායකර ඖෂධවලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය ආරම්භයේ සිට 2023.12.21 දින දක්වා එම කාර්යාලයන් වෙතින් පසු විපරම් කරන ලද පුනරුත්ථාපනලාභීන්ගේ සංඛ්‍යාවන් පහත සඳහන් පරිදි වේ :-

අ/අ	පුනරුත්ථාපනය වූවන්ගේ ආර්ථික, සමාජයීය, සුභසාධන කටයුතු සම්බන්ධීකරණ කාර්යාල	2013 සිට 2023.12.31 දක්වා සමාජගත කළ පුනරුත්ථාපනලාභීන් සංඛ්‍යාව	2013 සිට 2023.12.31 දක්වා පසුවිපරම් කළ පුනරුත්ථාපනලාභීන්ගේ සංඛ්‍යාව	2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා පසු විපරම් කරන ලද සංඛ්‍යාව
1	කොළඹ I	1,398	1,341	319
2	කොළඹ II	1,229	1,188	261
3	ගම්පහ	2,164	1,889	352
4	කළුතර	410	399	68
5	පුත්තලම	250	228	95
6	කුරුණෑගල	621	616	103
7	ගාල්ල	883	841	264
8	හම්බන්තොට	259	258	407
9	මහනුවර	237	234	283
10	අනුරාධපුර	254	249	489
11	පොළොන්නරුව	73	71	18
12	මඩකලපුව	53	49	25
13	යාපනය	155	119	97
	එකතුව	**7,986**	**7,482**	**2,781**

3.5 පුනරුත්ථාපනය වූවන්ගේ ආර්ථික, සාමාජීය හා සුභසාධන කටයුතු සම්බන්ධීකරණ කාර්යාල වෙතින් සිදු කරන ලද වැඩසටහන්/ දැනුවත් කිරීම්

සමාජගත පුනරුත්ථාපනලාභීන්ගේ ආර්ථික, සමාජ තත්ත්වයන් ඉහළ නැංවීම සඳහා අවැසි සුභසාධන කටයුතු සිදු කිරීම පුනරුත්ථාපනය වූවන්ගේ ආර්ථික, සාමාජයීය හා සුභසාධන කටයුතු සම්බන්ධීකරණ කාර්යාලයන්ගේ ප්‍රධාන පරමාර්ථය වේ. එසේ වුවද මෙම කාර්යාල විසින් ප්‍රජාවගේ සුභසිද්ධිය උදෙසා විවිධ විද්වත් නිලධාරි/අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සම්පත්දායකයින්/ සමාජ සේවා උපදේශන නිලධාරි/ පොලිස් මත්ද්‍රව්‍ය නාශක අංශ නිලධාරි දායකත්වයෙන් සමාජයේ එක් එක් ස්ථරයන් සඳහා සමාජයීය වශයෙන් වැදගත් වන දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. ඒ අතරින් වර්තමානයේ වඩාත් ව්‍යසනයක්ව පවතින පාසල් දරුවන් මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වීමට ඇති ප්‍රවණතාවය මත ඒ පිළිබඳ පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන් බොහොමයක් දිවයින පුරා පිහිටි පාසල් තුළ සිදු කරන ලදි. එහිදී මත්ද්‍රව්‍ය භාවිතයේ ඇති අනිටු ප්‍රතිඵල, මත්ද්‍රව්‍යවලට ඇති වන පෙළඹීම/ ඉන් මිදීම ආදිය පිළිබඳ වඩාත් හරවත් දේශනයන් පවත්වන ලදි. ඒ අනුව 2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා පුනරුත්ථාපනය වූවන්ගේ ආර්ථික, සාමාජයීය හා සුභසාධන කටයුතු සම්බන්ධීකරණ කාර්යාලයන් විසින් සිදුකරන ලද වැඩසටහන් විස්තරය පහත සඳහන් පරිදි දැක්විය හැක.

අ/අ	විස්තරය	සිදු කරන ලද වැඩසටහන් සංඛ්‍යාව
1	පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන්	525
2	රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන්	90
3	ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන්	188
4	මත්ද්‍රව්‍යයට ඇබ්බැහිවූවන් දැනුවත් කිරීමේ වැඩසටහන්	44
5	පුද්ගල හා පවුල් උපදේශන වැඩසටහන්	106
	එකතුව	**953**



පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන්



ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන්



රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන්

4. කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන්

පුනරුත්ථාපන ක්‍රියාවලිය සාර්ථකව හා ඉහළ ගුණාත්මකතාවයකින් යුතුව ඉදිරියට පවත්වාගෙන යාමේදී එම ක්‍රියාවලිය පිළිබඳ මනා දැනුම සහිත පුහුණුවලත් කාර්ය මණ්ඩලයකින් සමන්විත වීම ඉතා වැදගත් වේ. පුනරුත්ථාපනලාභීන් සමඟ මනා සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් යහපත් පුරවැසියන් වශයෙන් ඔවුන් සමාජගත කිරීම සඳහා මේ වන විට රාජකාරියේ නියතු කාර්ය මණ්ඩල සමාජිකයින් වෙනුවෙන් ඔවුන්ගේ විෂයය ට සමගාමීව දැනුම හා පුහුණුව වැඩි දියුණු කිරීම සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානයන්හි විද්වතුන් සම්බන්ධ කර ගනිමින් පුහුණු පාඨමාලාවන්, ක්‍රියාකාරකම් හා වැඩසටහන් 2023 වර්ෂය තුළදී පහත පරිදි සිදු කර ඇත. :-

අ/අ	පාඨමාලාව/වැඩසටහන්	දිනය	සහභාගී වූ සංඛ්‍යාව
1	පෞරුෂ සංවර්ධන එක් දින දැනුවත් කිරීමේ වැඩසටහන	2023.01.27	32
2	මත්ද්‍රව්‍ය උපදේශන පිළිබඳ එක් දින සහතික පත්‍ර වැඩසටහන	2023.01.07	10
3	තෙදින උපදේශන වැඩසටහන්	2023.02.13-15	3
4	මී මැසි පාලනය පිළිබඳ එක් දින දැනුවත් කිරීමේ වැඩසටහන	2023.02.20	38
5	රාජ්‍ය ආයතනවල විගණන ප්‍රශ්ණ අවම කිරීම පිළිබඳ දෙදින දැනුවත් කිරීමේ වැඩසටහන	2023.03.22 - 23	7
6	අභ්‍යන්තර විගණනය සහ අභ්‍යන්තර පාලන ක්‍රම පිළිබඳ දෙදින දැනුවත් කිරීමේ වැඩසටහන	2023.04.24-25	3
7	කාලය සහ ජීවිතය කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ එක් දින වැඩසටහන	2023.05.10	70
8	හෘදයාබාධයක් ඇති වූ විට ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ එක් දින දේශනය	2023.05.12	50
9	පුනරුත්ථාපනලාභීන්ගේ ප්‍රයෝජනය සඳහා උණු වතුර ලබා දීමේ දී විදුලිබලය හා ගෑස් භාවිතය අවම කිරීම පිළිබඳ එක් දින දැනුවත් කිරීමේ වැඩසටහන	2023.05.15	25
10	නව පුනරුත්ථාපන කාර්යාංශ පනත පිළිබඳ දැනුවත් කිරීම සැබැඳි එක් දින වැඩසටහන	2023.05.17	73
11	මත්ද්‍රව්‍ය උපදේශනය පිළිබඳ එක් දින සහතික පත්‍ර වැඩසටහන	2023.06.17	1
12	සංගීත චිකිත්සාව පිළිබඳ එක් දින දැනුවත් කිරීමේ වැඩසටහන	2023.06.20	88
13	නායකත්වය පිළිබඳ එක් දින පුහුණු වැඩසටහන	2023.07.05	4
14	ජංගම ඇස් පරීක්ෂාව පිළිබඳ එක් දින සායනය	2023.07.07	52
15	හෘද පුනර්ජීවය පිළිබඳ එක් දින වැඩසටහන	2023.07.19	80
16	උපදේශන ආචාර ධර්ම හා ප්‍රතිපත්ති පිළිබඳ එක් දින දැනුවත් කිරීමේ වැඩසටහන	2023.07.26	38
17	උපදේශන වෘත්තීයමය භාවය පිළිබඳ එක් දින දේශනය	2023.07.26	85
18	ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ දැනුවත් කිරීමේ එක් දින වැඩසටහන	2023.08.17	91
19	රසවින්දනාත්මක එක් දින වැඩසටහන	2023.08.23	37
20	අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය වෙතින් උපදේශන නිලධාරීන් සඳහා පස් දින පුහුණු වැඩසටහන	2023.09.11-15	59
21	රසවින්දනාත්මක එක් දින වැඩසටහන	2023.09.20	59

අ/අ	පාඨමාලාව/වැඩසටහන්	දිනය	සහභාගී වූ සංඛ්‍යාව
22	ආකල්ප සංවර්ධනය, ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි පිළිබඳ සිව් දින පුහුණු වැඩසටහන	2023.10.02-05	20
23	උපදේශන පිළිබඳ එක් දින පුහුණු වැඩසටහන	2023.10.03	35
24	පුනරුත්ථාපන ක්‍රියාවලිය සඳහා මනෝ විද්‍යාත්මක මැදිහත් වීම පිළිබඳ වසරක ඩිප්ලෝමා පාඨමාලාව	2022.10.08 සිට 2023.10.07	47
25	රසවින්දනාත්මක එක් දින වැඩසටහන	2023.10.18	73
26	රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන	2023.10.12, 19,25,26	16
27	ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ දෙදින දැනුවත් කිරීමේ වැඩසටහන	2023.11.13-14	10
28	ආතති කළමනාකරණය පිළිබඳ එක් දින වැඩසටහන	2023.11.22	72
29	නිවේදන පුහුණු වැඩසටහන - අධියර I	2023.11.21-29	10
30	ඡායාරූපකරණය පිළිබඳ දෙදින පුහුණු පාඨමලාව	2023.12.05-06	18
31	නිවේදන පුහුණු වැඩසටහන - අධියර II	2023.12.07-15	10
32	රසවින්දනාත්මක එක් දින වැඩසටහන	2023.12.13	90





කාර්ය මණ්ඩලය පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීම.

5. පුනරුත්ථාපන ක්‍රියාවලිය සඳහා යටිතල පහසුකම් සැපයීම

පුනරුත්ථාපන කාර්යාංශ මූලස්ථාන කාර්යාලය, පුනරුත්ථාපන මධ්‍යස්ථාන හා පුනරුත්ථාපනය වූවන්ගේ ආර්ථික, සාමාජයීය හා සුභසාධන කටයුතු සම්බන්ධීකරණ කාර්යාලවල අවශ්‍යතා සඳහා වන භාණ්ඩ/ උපකරණ/ ද්‍රව්‍ය /සේවා සහ ඒවායේ යටිතල පහසුකම් සංවර්ධන කටයුතුවලට අදාළ අමුද්‍රව්‍ය අවශ්‍යතා හා සේවාවන් කාර්යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සීමාවන්ට යටත්ව සහ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව යටතේ මිලදී ගැනීමට ක්‍රියාකර ඇත. මේ අනුව ලබා ගන්නා ලද සියලුම බඩු බාහිරාදිය/ උපකරණ මෙම කාර්යාංශ ප්‍රධාන වට්ටෝරු භාණ්ඩ ලෙජර්වල නිවැරදිව ලේඛනගත කර එක් එක් ආයතනයේ අවශ්‍යතාවය අනුව නිකුත් කරනු ලබන අතර, එම උපකරණ/ භාණ්ඩවල විස්තර ඒ ඒ පුනරුත්ථාපන මධ්‍යස්ථාන හා පුනරුත්ථාපනය වූවන්ගේ ආර්ථික, සාමාජයීය හා සුභසාධන කටයුතු සම්බන්ධීකරණ කාර්යාල මට්ටමින්ද උප වට්ටෝරු භාණ්ඩ ලෙජර් නඩත්තුව සඳහාද කටයුතු කර ඇත.

5.1 ඉදිකිරීම් කටයුතු

2023 වර්ෂයට අදාළව තෘතීයික හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය - සේනපුර , ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - කන්දකාඩු , ඒකාබද්ධතා මධ්‍යස්ථානය - වව්නියාව යන මධ්‍යස්ථානයන්හි පුනරුත්ථාපනය වන පුනරුත්ථාපනලාභීන්ගේ නේවාසිකාගාර, පුහුණු හා පාලන අවශ්‍යතාවයන්ට අදාළ ඉදිකිරීම් මෙන්ම පුනරුත්ථාපනය වූවන්ගේ ආර්ථික සමාජයීය හා සුභසාධන කටයුතු සම්බන්ධීකරණ කාර්යාලයන්හි පාලන අවශ්‍යතාවයන්ට අදාළ ඉදිකිරීම්වල විස්තරය හා ඊට අදාළ ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ :-

5.1.1 ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - කන්දකාඩු

අ/අ	අස්ථිත්වයේ නම	ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය %
1	පිටත සහ ඇතුළත වැට ඉදිකිරීම.	85%
2	විදුලිජනක යන්ත්‍රාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම	100%
3	මධ්‍යස්ථාන රෝහලෙහි ඉතිරි වැඩ නිම කිරීම.	100%
4	නිලධාරි නේවාසිකාගාර ගොඩනැගිලි 02 ඉදිකිරීම. (කොට්ඨාස අංක 01)	63%
5	නිලධාරි නේවාසිකාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම. (කොට්ඨාස අංක 02)	68%
6	වැසිකිළි පද්ධති 03 ඉදිකිරීම.	100%
7	විදුලිවැට ඉදිකිරීම.	100%

5.1.2. තෘතීයික හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය - සේනපුර

අ/අ	අස්ථිත්වයේ නම	ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය %
1	වැසිකිළි පද්ධති 02 ඉදිකිරීම.	100%
2	පුනරුත්ථාපනලාභීන් සඳහා ස්නානය කිරීමේ ස්ථානයක් ඉදිකිරීම.	100%
3	ජලය බෙදාහැරීමේ පද්ධතිය සහ ජල අපවහන පද්ධතිය ඉදිකිරීම.	94%
4	පුනරුත්ථාපනලාභීන් සඳහා ආහාර ගැනීමේ ස්ථානය සහ රූපවාහිණි නැරඹුම් මැදිරිය ඉදිකිරීම.	100%
5	ප්‍රධාන කාර්යාලය, සකාස කාර්යාලය අලුත්වැඩියා කිරීම.	100%
6	ආරක්ෂක මුරකුටි ඉදිකිරීම.	100%
7	අධ්‍යක්ෂ නිල නිවස්නය ඉදිකිරීම.	100%
8	පොලිස් නේවාසිකාගාරය ඉදිකිරීම.	100%
9	නිලධාරි දෙමහල් නේවාසිකාගාරය ඉදිකිරීම.	100%
10	වගාකර ඇති ප්‍රදේශය වටා අලි වැට හා ආරක්ෂක වැට ඉදිකිරීම.	100%

6. පුනරුත්ථාපනලාභීන්හට ආහාර පාන ලබා දීම

පුනරුත්ථාපන මධ්‍යස්ථානවල කාර්ය මණ්ඩලය වශයෙන් රාජකාරි කටයුතු සඳහා යාකර ඇති හමුදා සාමාජිකයන්ට වෛද්‍ය නිර්දේශය මත යුද්ධ හමුදාව වෙතින් පිළියෙල කර ඇති හමුදා ආහාර වට්ටෝරුව ඒ අයුරින්ම යුද හමුදා සැපයුම ස්ථාන වෙතින් ලබාගෙන විෂ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූ පුනරුත්ථාපනලාභීන්හට පෝෂ්‍යදායි පිසූ ආහාර වශයෙන් නිකුත් කරනු ලැබේ.

6.1 ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - කන්දකාඩු හා තෘතීයික හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය - සේනපුර මධ්‍යස්ථානයන්හි නේවාසික පුනරුත්ථාපනලාභීන්හට හිමිගැන්වෙන ආහාර වට්ටෝරුව

සඳුදා	ශීමිකම ප්‍රමාණය	අඟහරුවාදා	ශීමිකම ප්‍රමාණය	බදාදා	ශීමිකම ප්‍රමාණය	බ්‍රහස්පතින්දා	ශීමිකම ප්‍රමාණය	සිකුරාදා	ශීමිකම ප්‍රමාණය	සෙනසුරාදා	ශීමිකම ප්‍රමාණය	ඉරිදා	ශීමිකම ප්‍රමාණය
උදා ආහාරය													
සුදු කැකුළු	170g	පාන්/සුදු කැකුළු	170g	රතු කැකුළු බත්	170g	සුදු කැකුළු බත්	170g	සුදු කැකුළු	170g	පාන්/සුදු කැකුළු	170g	සුදු කැකුළු	170g
අර්තාපල්	070g	ම/පරිප්පු	030g	කඩල කරි	30g	ම/පරිප්පු	30g	ම/පරිප්පු	030g	ම/පරිප්පු	30g	ම/පරිප්පු	30g
පොල් සම්බෝල	25g	පොල් සම්බෝල	025g	පොල් සම්බෝල	25g	පොල් සම්බෝල	25g	පොල් සම්බෝල	25g	පොල් සම්බෝල	25g	පොල් සම්බෝල	25g
දිවා ආහාරය													
සම්බා බත්	190g	සම්බා බත්	190g	සම්බා බත්	190g	සම්බා බත්	190g	සම්බා බත්	190g	සම්බා බත්	190g	සම්බා බත්	190g
තලපත් මාළු	070g	වියළි හාල්මැස්සන්	57g	ශු/ක කුකුල් මස්	75g	තලපත් මාළු මිරිසට	70g	ශු/ක කුකුල් මස්	75g	ශු/ක කුකුල් මස්	75g	තලපත් මාළු	70g
ආර්ථාපල් කරිය	070g	ම/පරිප්පු	25g	නි/බෝංචී	70g	නිවිති සහ පරිප්පු	70g	කඩල පරිප්පු	25g	අර්ථාපල්	70g	ම/පරිප්පු	25g
බණ්ඩක්කා	070g	ඕට රුට	70g	පිපිඤ්ඤා	70g	වම්බටු	70g	කරවිල	70g	පපඩම	10g	කැරට	70g
මුකුණු වැන්නා	070g	කංකුන්	70g	පරිප්පු	25g	ඕට රුට	70g	ගොටුකොළ	57g	කංකුන්	70g	මු/වැන්නා	70g
රාත්‍රී ආහාරය													
සම්බා බත්	190g	සම්බා බත්	190g	සුදු කැකුළු බත්	170g	සම්බා බත්	190g	සම්බා බත්	190g	රතු කැකුළු	170g	සම්බා බත්	190g
වියළි හාල් මැස්සන්	57g	වම්බටු	070g	ලීක්ස්	70g	කොහිල අල	70g	බණ්ඩක්කා	70g	නි/බෝංචී	70g	ලීක්ස්	70g
ම/පරිප්පු	25g	කි/ බිත්තර	1	ටින් මාලු	57g	බිත්තර කරිය	1	වියලි හාල්මැස්සන්	57g	ටින් මාළු	57g	වී/හාල් මැස්සන්	57g
නිල් බෝංචී	070g	ගෝවා	70g	අර්ථාපල්	70g	ම/ පරිප්පු	25g	වට්ටක්කා	70g	ගෝවා	70g	අර්ථාපල්	70g

6.2 ඒකාබද්ධතා මධ්‍යස්ථානය - වව්නියාවෙහි නේවාසික පුනරුත්ථාපනලාභීන්හට හිමිගැන්වෙන ආහාර වට්ටෝරුව

සඳුදා	සීමාකම් ප්‍රමාණය	අඟහරුවාදා	සීමාකම් ප්‍රමාණය	බදාදා	සීමාකම් ප්‍රමාණය	බ්‍රහස්පතින්දා	සීමාකම් ප්‍රමාණය	සිකුරාදා	සීමාකම් ප්‍රමාණය	සෙනසුරාදා	සීමාකම් ප්‍රමාණය	ඉරිදා	සීමාකම් ප්‍රමාණය
තේ පානය - 0500 පැයට													
කිරි තේ		කිරි තේ		කිරි තේ		කිරි තේ		කිරි තේ		කිරි තේ		කිරි තේ	
උදා ආහාරය													
සුදු කැකුළු බත්/පාන්	170g	සුදු කැකුළු	170g	රතු කැකුළු බත්	170g	සුදු කැකුළු බත්	170g	සුදු කැකුළු බත් පාන්	170g	සුදු කැකුළු කිරි බත්	170g	රතු කැකුළු බත්	170g
තලපත් මාළු මිරිසට	070g	ම/පරිප්පු	030g	කඩල කරිය	030g	ම/පරිප්පු	30g	ම/පරිප්පු	030g	කෙලවල්ලා මාළු ඇඹුල් තියල්	030g	මුං ඇට කරිය	030g
පරිප්පු කරිය	025g	පොල් සම්බෝල	025g	පොල් සම්බෝල	025g	පොල් සම්බෝල	025g	පොල් සම්බෝල	025g	කවට සම්බෝල	025g	පොල් සම්බෝල	025g
තේ පානය 1000 පැය													
කිරි තේ		කිරි තේ		කිරි තේ		කිරි තේ		කිරි තේ		කිරි තේ		කිරි තේ	
දිවා ආහාරය													
සම්බා ප්‍රයිඩ් රයිස් බත්	190g	සම්බා බත්	190g	සම්බා බත්	190g	සම්බා බත්	190g	සම්බා බත්	190g	සම්බා බත්	190g	සම්බා බත්	190g
කුකුල් මස්	075g	ඩියළි හාල්මැස්සෝ බැදුම්	057g	කුකුල් මස්	075g	තලපත් මාළු මිරිසට	070g	කරවල තෙලට	057g	කුකුල් මස්	075g	තෝරා මාළු	070g
ආර්ටාපල් කරිය	070g	කඩල පරිප්පු කරිය	025g	ආර්ටාපල් කිරට	070g	අර්ටාපල් කරිය	070g	පරිප්පු කරිය	025g	පරිප්පු කරිය	025g	නිවිති සහ පරිප්පු කරිය	070g
පඩම් බැද	010g	කරවිල ව්‍යාංජනය	070g	වම්බටු මෙක්සුව්	070g	බණ්ඩක්කා ව්‍යාංජනය	070g	වටවක්කා කරිය	070g	කැරට ව්‍යාංජනය	070g	වම්බටු ව්‍යාංජනය	070g
කන්කුන් තෙලට	070g	ගොටු කොළ සම්බල්	057g	බීට්රූට් ව්‍යාංජනය	070g	කොලඟෝවා මැල්ලුම්	070g	මුකුණු වැන්නා	070g	මුකුණුවැන්නා	070g	බීට් රූට් ව්‍යාංජනය	070g
තේ පානය - 1700 පැයට													
කහට තේ		කහට තේ		කහට තේ		කහට තේ		කහට තේ		කහට තේ		කහට තේ	
රාත්‍රී ආහාරය													
සම්බා බත්	190g	සම්බා බත්	190g	සුදු කැකුළු බත්	170g	සම්බා බත්	190g	සම්බා බත්	190g	සම්බා බත්	170g	සම්බා බත්	190g
කෙලවල්ලා මාළු මිරිසට	070g	තලපත් මාළු කිරට	070g	තලපත් මාළු මිරිසට	070g	ශුෂ්ක කුකුල් මස් බැද කරිය	075g	ශුෂ්ක කුකුල් මස්	075g	තලපත් මාළු	070g	කරවල තෙලට	057g
ගෝවා මැල්ලුම	070g	වටවක්කා කපු කරිය	070g	ගෝවා තෙලට	070g	පරිප්පු කරිය	025g	බීට් රූට් ව්‍යාංජනය	070g	අර්ටාපල් කිරට	070g	පරිප්පු කරිය	025g
නි/බෝංචී ව්‍යාංජනය	070g	මාළු මිරිස් තෙලට	070g	කැරට ව්‍යාංජනය	070g	නි/බෝංචී ව්‍යාංජනය	070g	බණ්ඩක්කා ව්‍යාංජනය	070g	වම්බටු ව්‍යාංජනය	070g	කොඟිල අල ඇඹුලි	070g
කැනිරි ව්‍යාංජනය	070g	බීට් රූට් තෙලට	070g	ගොටුකොළ සම්බල්	070g	ලීක්ස් තෙලට	070g	අර්තාපල් තෙලට	070g	බීට්රූට් ව්‍යාංජනය	070g	කැරට ව්‍යාංජනය	070g

7. ආරක්ෂාව

2023.12.31 දිනට සෑම මධ්‍යස්ථානයක් සඳහාම ශ්‍රී ලංකා යුද්ධ හමුදාව හා ශ්‍රී ලංකා පොලිසිය මඟින් ආරක්ෂාව සැපයීමට කටයුතු කර ඇති අතර, ඒ ඒ මධ්‍යස්ථාන සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙන් හා ශ්‍රී ලංකා පොලිසියෙන් ලබාදී ඇති ආරක්ෂක භට පිරිස් සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ. :-

අ/අ	පුනරුත්ථාපන මධ්‍යස්ථානය	යුද්ධ හමුදා ආරක්ෂක බණ්ඩය		පොලිස් නිලධාරි	
		නිලධාරි	සෙසුනිල	නිලධාරි	පොලිස් කොස්තාපල්
1	ඒකාබද්ධතා මධ්‍යස්ථානය - වව්නියාව	1	30	1	1
2	තෘතියික හා වෘත්තිය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය- සේනපුර	1	60	1	3
3	ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - කන්දකාඩු	1	76	1	5

8. 2024 වර්ෂය සඳහා වන සැලසුම්

8.1. මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනට සමගාමීව මෙම කාර්යාංශය මඟින් දැනට ක්‍රියාත්මක අන්තරායකර ඖෂධ වලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීමේ කටයුතු තවදුරටත් පුළුල් කරමින් වැඩි පිරිසක් එකවර පුනරුත්ථාපනය කිරීමට සැලසුම් කර ඇත. ඒ යටතේ නව පුනරුත්ථාපන මධ්‍යස්ථාන ආරම්භ කිරීම සඳහා වන පහත සඳහන් ඉඩම් හා ගොඩනැගිලි පවරා ගැනීම කඩිනම් කර ගැනීම.

(අ.) කන්තලේ සීනි කර්මාන්ත ආයතනයට අයත් යොවුන් සේනාංකය පවත්වාගෙන යන ලද ඉඩම සතු ගොඩනැගිලි පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා කන්තලේ සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලය වෙතින් තාවකාලිකව මෙම කාර්යාංශය වෙත පවරා දී ඇත. එහි විධිමත් පැවරීම් කටයුතු මේ වන විටත් සිදුවෙමින් පවතින අතර, පුරුත්ථාපන මධ්‍යස්ථානයක් වශයෙන් ස්ථාපිත කිරීම සඳහා වන යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සහ කාර්ය මණ්ඩලය ඇතුළු සියලු අවශ්‍යතා සපයා ගැනීමේ අවශ්‍යතාවයක් පවති.

8.2. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් මෙම කාර්යාංශයේ ඒ ඒ තනතුරු සඳහා 262 ක කාර්ය මණ්ඩලයක් අනුමත කොට ඇත. එහි තනතුරු අතුරින් පුරප්පාඩු තනතුරු සඳහා කාර්ය මණ්ඩලයන් කඩිනමින් බඳවා ගැනීමේ දැඩි අවශ්‍යතාවයක් පවති.

8.3. අන්තරායකර ඖෂධ වලට ඇබ්බැහි වූ කාන්තාවන් පුනරුත්ථාපනය කිරීම සඳහා මෙම කාර්යාංශය යටතේ ක්‍රියාත්මක වව්නියාව ඒකාබද්ධතා මධ්‍යස්ථානයෙහි සංවර්ධන කටයුතු මේ වන විට අවසන් කොට ඇත. මෙහි පුනරුත්ථාපන කටයුතු ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය හා මධ්‍යස්ථානයෙහි ආරක්ෂාව සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය සපයා ගැනීම් අවශ්‍යතාවයක් පවති.

මූල්‍ය ප්‍රකාශන - 2023

9. මුල්‍ය ප්‍රකාශන - 2023

පුනරුත්ථාපන කාර්යාංශය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

		2023
	සටහන්	රු.
ලැබීම්		
භාණ්ඩාගාර ප්‍රදාන - පුනරාවර්තන (වැටුප්)		109,533,986
භාණ්ඩාගාර ප්‍රදාන - පුනරාවර්තන (වෙනත්)	1	420,815,460
විවිධ ආදායම්	2	4,320
භාණ්ඩාගාර ප්‍රදාන - ප්‍රාග්ධන	3	172,968,326
මුළු ලැබීම්		703,322,092
වියදම		
පරිපාලන වියදම්	4	110,837,204
සැපයුම් හා අවශ්‍යතා	5	342,320,007
පුහුණු හා සංවර්ධන	6	29,186,479
ගිවිසුම්ගත සේවා හා නඩත්තු වියදම්	7	122,156,006
අනෙකුත් මෙහෙයුම් වියදම්	8	41,946,006
ක්ෂය වීම්	9	123,265,653
මුළු වියදම		769,711,355
මෙහෙයුම් අතිරික්තය/(ඌණතාවය)		**(66,389,263)**

පුනරුත්ථාපන කාර්යාංශය

2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

	සටහන්	2023 රු.
වත්කම්		
ජංගම නොවන වත්කම		
දේපළ, පිරියත හා උපකරණ	10	1,273,852,070
සිදුවෙමින් පවතින ප්‍රාග්ධන වැඩ	11	150,337,020
ජංගම වත්කම්		
තොගය	12	53,889,429
කලින් ගෙවීම්	13	1,132,987
මුදල් හා මුදල් සමාන දෑ	14	2,293,254
මුළු වත්කම්		1,481,504,762
බැරකම්		
ජංගම නොවන බැරකම්		
ජංගම බැරකම්		
වෙන් කිරීම් හා වෙනත් බැරකම්	15	65,199,870
මුළු වගකීම්		65,199,870
ශුද්ධ වත්කම්		**1,416,304,892**
ශුද්ධ වත්කම්/ස්කන්ධය		
ප්‍රාග්ධන සහ සංචිත		
සමුච්චිත ප්‍රාග්ධන අරමුදල	16	1,480,373,470
සමුච්චිත ප්‍රාග්ධන අරමුදල (කෘෂිකර්ම ව්‍යාපෘතිය)		2,320,685
සමුච්චිත අතිරික්තය/ (ඌණතාවය)		(66,389,263)
මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධය		**1,416,304,892**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අනුව පිළියෙල කරන ලද 2023 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පාලක සභාව වෙත සපයා ඇති වාර්තා අනුව සත්‍ය හා සාධාරණ ලෙස පිළියෙල කර ඇති බව මෙයින් සහතික කරන්නෙමු.

එස් එම් විජේසේකර,
ගණකාධිකාරි,
පුනරුත්ථාපන කාර්යාංශය.

ඩීඩීයූකේ හෙට්ටිආරච්චි ආර්එස්පී වීඑස්වී,
යූඑස්පී එන්ඩීයූ පීඑස්සී එම්ඒ,
මේජර් ජෙනරල් (විශ්‍රාමික),
පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්,
පුනරුත්ථාපන කාර්යාංශය.

මෙකී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පුනරුත්ථාපන කාර්යාංශයේ පාලක සභාව සතු වගකීමකි. පුනරුත්ථාපන කාර්යාංශයේ පාලක සභාව සහ ඔවුන් වෙනුවෙන් අත්සන් තබා මෙකී මූල්‍ය ප්‍රකාශන අනුමත කරමු.

යූ ආර් ද සිල්වා (ජනාධිපති නීතීඥ),
සභාපති,
පුනරුත්ථාපන කාර්යාංශය.

සී සුරේෂ්වරන්,
පාලක සභා සාමාජික,
පුනරුත්ථාපන කාර්යාංශය.

පුනරුත්ථාපන කාර්යාංශය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය

විස්තරය	සමුච්චිත ප්‍රාග්ධන අරමුදල (රු.)	සමුච්චිත ප්‍රාග්ධන අරමුදල (කෘෂිකර්ම ව්‍යාපෘතිය) (රු.)	සමුච්චිත අතිරික්තය/ ඌණතාවය	මුළු ශුද්ධ වත්කම්/ ස්කන්ධය (රු.)
2023.01.01 දිනට ශේෂය	1,542,285,013	2,320,685	-	1,544,605,697
වත්කම් අගය නිවැරදි කිරීම	(61,911,543)		-	(61,911,543)
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/ ඌණතාවය	-	-	(66,389,263)	(66,389,263)
2023.12.31 දිනට ශේෂය	**1,480,373,470**	**2,320,685**	**(66,389,263)**	**1 ,416,304,892**

සටහන්

ජංගම නොවන වත්කම් වල ආරම්භක ශේෂවල සිදුකරන ලද නිවැරදි කිරීම් ඉහත වත්කම් අගය නිවැරදි කිරීම් තුළ ඇතුළත් වේ. විස්තර පහත පරිදි වේ. :-

	වටිනාකම (රු.)	වටිනාකම (රු.)
ගොඩනැගිලි වටිනාකම නිවැරදි කිරීම		
සිදුවෙමින් පවතින ප්‍රාග්ධන වැඩ ලෙස හඳුනාගත් අගය	(298,037,684)	
අලුත්වැඩියා ලෙස හඳුනාගත් අගය	(15,064,082)	
වටිනාකම නිවැරදි කිරීම	(42,094,467)	(355,196,232)
සිදුවෙමින් පවතින ප්‍රාග්ධන වැඩ වටිනාකම නිවැරදි කිරීම		
ගොඩනැඟිලි ලෙස හඳුනාගත් අගය	(42,494,170)	
අලුත්වැඩියා ලෙස හඳුනාගත් අගය	(1,536,975)	
වටිනාකම නිවැරදි කිරීම	24,276,772	(19,754,373)
මෝටර් රථ වටිනාකම නිවැරදි කිරීම		45,800,000

	වටිනාකම (රු.)	වටිනාකම (රු.)
පරිගණක උපාංග වටිනාකම නිවැරදි කිරීම		
වාර්තා නොකළ වත්කම්	67,080,877	
පරිභෝජන ද්‍රව්‍ය ලෙස හඳුනාගත් අගය	(110,250)	66,970,627
ගෘහ භාණ්ඩ, සවිකිරීම් හා කාර්යාල උපකරණ වටිනාකම නිවැරදි කිරීම.		
පරිභෝජන ද්‍රව්‍ය ලෙස හඳුනාගත් අගය	(8,053,653)	
පරිගණක හා උපාංග ලෙස හඳුනාගත් අගය	(1,609,901)	
පිරියත, යන්ත්‍රෝපකරණ හා අනෙකුත් උපකරණ ලෙස හඳුනාගත් අගය	(8,557,187)	
වාර්තා නොකළ වත්කම්	130,478,540	112,257,799
පිරියත, යන්ත්‍රෝපකරණ හා වෙනත් උපකරණ වටිනාකම නිවැරදි කිරීම		
පරිභෝජන ද්‍රව්‍ය ලෙස හඳුනාගත් අගය	(2,598,472)	
පරිගණක හා උපාංග ලෙස හඳුනාගත් අගය	(5,076,600)	
පිරියත, යන්ත්‍රෝපකරණ හා අනෙකුත් උපකරණ ලෙස හඳුනාගත් අගය	(2,236,155)	
වටිනාකම නිවැරදි කිරීම	(454,796)	
වාර්තා නොකළ වත්කම්	89,996,239	79,630,216
ගොඩනැගිලි බෙදා වෙන් කිරීම් නිවැරදි කිරීම		8,380,420
		(61,911,543)

පුනරුත්ථාපන කාර්යංශය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2023 රු.	2023 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන්		
භාණ්ඩාගාර ප්‍රදාන ලැබීම් - පුනරාවර්තන (වැටුප්)	109,533,986	
භාණ්ඩාගර ප්‍රදාන ලැබීම් - පුනරාවර්තන (වෙනත්)	356,060,297	
භාණ්ඩාගාර ප්‍රදාන ලැබීම් - කෘෂි ව්‍යාපෘතිය	9,527,670	
විවිධ අදායම්	4,320	
වැටුප් හා දීමනා ගෙවීම්	(109,210,481)	
වෙනත් පුනරාවර්තන වියදම් ගෙවීම්	(361,120,805)	
මූලික නිකුත් කිරීම් මිලදී ගැනීම්	(49,240,738)	
පරිභෝජන ද්‍රව්‍ය මිලදී ගැනීම්	(10,410,288)	
පරිභෝජන ද්‍රව්‍ය මිලදී ගැනීම් (කෘෂි ව්‍යාපෘතිය)	(9,527,670)	
පුහුණු හා සංවර්ධන වියදම් ගෙවීම්	(25,745,349)	
පශ්චාත් පුනරුත්ථාපන කටයුතු සඳහා ගෙවීම්	(3,208,351)	
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		(93,337,410)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන්		
ගෘහභාණ්ඩ, සවිකිරීම් හා කාර්යාල උපකරණ මිලදී ගැනීම්	(1,422,086)	
පරිගණක හා උපාංග මිලදී ගැනීම්	(9,933,699)	
පිරියත, යන්ත්‍රෝපකරණ හා අනෙකුත් උපකරණ මිලදී ගැනීම්	(988,814)	
සිදුවෙමින් පවතින් ප්‍රාග්ධන වැඩ සඳහා ද්‍රව්‍ය මිලදී ගැනීම	(34,671,940)	
රථ වාහන මිලදී ගැනීම් (කෘෂි වාහන සඳහා කොටස්)	(1,141,440)	
ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා ගෙවීම්	(29,179,683)	
ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		(77,337,662)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		
භාණ්ඩාගාර ප්‍රදාන ලැබීම් - ප්‍රාග්ධන	171,826,886	
භාණ්ඩාගාර ප්‍රදාන ලැබීම් - කෘෂි ව්‍යාපෘතිය	1,141,440	
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		172,968,326
මුදල්, මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)		2,293,254
2023.01.01 දිනට මුදල්, මුදල් හා සමාන දෑ		-
2023.12.31 දිනට මුදල්, මුදල් හා සමාන දෑ		**2,293,254**

<u>මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සඳහා සටහන්</u>

මුදල් හා මුදල් සමාන දෑ බැංකු ගිණුමේ ඇති ශේෂයෙන් සමන්විත වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් හා මුදල් සමාන දෑ තුළ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුළත් පහත දැක්වෙන වටිනාකමෙන් සමන්විත වේ.

	2023
මුදල් හා මුදල් සමාන දෑ	රු.
ලංකා බැංකුව- බොරැල්ල සුපිරි ශාඛාව (0007042763)	2,293,254
සුළු මුදල් අග්‍රිමය	-
	2,293,254

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සඳහා සටහන්

	2023
සටහන් 01	රු.
භාණ්ඩාගාර ප්‍රදාන - පුනරාවර්තන (වෙනත්)	
ලැබීම් - වෙනත් - පුනරාවර්තන	356,060,297
ලැබීම් - කෘෂිකර්ම ව්‍යාපෘතිය	9,527,670
වැය ශීර්ෂ අතර මාරුවීම් සලාක හා ඉන්ධන	55,227,493
	420,815,460

සටහන

2023.01.01 සිට 2023.04.30 දක්වා සලාක හා ඉන්ධන වැය ශීර්ෂ අතර මාරුවීම් තුළ පහත වටිනාකම් ඇතුළත් වේ. මෙම වැය ශීර්ෂ අතර මාරුවීම් අධිකරණ අමාත්‍යාංශය විසින් යුධ හමුදාපති වෙත සිදු කරන ලදී. එය කාර්යාංශයේ වියදම තුළ සහ ශ්‍රී.ල.රා.ඇ.ගි.ප්‍ර 11 අනුව අදායම තුළ ඇතුළත් වේ.

සලාක සඳහා වැය ශීර්ෂ අතර මාරුවීම්	33,221,776
ඉන්ධන සඳහා වැය ශීර්ෂ අතර මාරුවීම්	22,005,717
	55,227,493

සටහන් 02	
විවිධ ආදායම්	
පරණ පත්තර විකිණීමෙන් ලද ආදායම	**4,320**

සටහන් 03	රු.
භාණ්ඩාගාර ප්‍රදාන - ප්‍රාග්ධන	
ලැබීම් - ප්‍රාග්ධන	171,826,886
ලැබීම් - කෘෂිකර්ම ව්‍යාපෘතිය	1,141,440
	172,968,326

සටහන් 04	රු.
පරිපාලන වියදම්	
වැටුප් හා වේතන	29,578,757
වෙනත් දීමනා	11,016,096
අතිකාල දීමනා	1,789,840
විශේෂ දීමනා	65,692,353
දේශීය ගමන් වියදම්	877,548
සභාපතිතුමාගේ මාසික දීමනාව	525,000
සභාපතිතුමාගේ ප්‍රවාහන හා ඉන්ධන දීමනාව	700,610
පාලක සභාවේ සහභාගීත්ව හා ප්‍රවාහන දීමනාව	627,000
විගණන කමිටුවේ සහභාගීත්ව හා ප්‍රවාහන දීමනාව	30,000
	110,837,204

සටහන් 05	රු.
සැපයුම් හා අවශ්‍යතා	
ලිපිද්‍රව්‍ය	7,639,167
ඉන්ධන	85,901,268

	රු.
සලාක	167,163,702
සුබසාධන ද්‍රව්‍ය නිකුත් කිරීම්	7,905,442
ක්‍රීඩා හා විනෝදාත්මක	195,730
මූලික අවශ්‍යතා නිකුත් කිරීම්	48,032,105
පරිභෝජන ද්‍රව්‍ය	25,482,593
	342,320,007

සටහන් 06

පුහුණු හා සංවර්ධන	රු.
පුහුණු වැඩසටහන් - පුනරුත්ථාපනලාභීන්	23,032,949
හැකියාවන් ගොඩනැංවීම - කාර්ය මණ්ඩලය	2,945,179
පශ්චාත් පුනරුත්ථාපන කටයුතු	3,208,351
	29,186,479

සටහන් 07

ගිවිසුම්ගත සේවා හා නඩත්තු වියදම්	රු.
වාහන නඩත්තු	15,584,673
ගොඩනැගිලි නඩත්තු	7,986,798
උපකරණ නඩත්තු	6,173,082
දුරකථන	3,965,399
විදුලිය හා ජලය	41,563,298
තැපැල්	120,000
ගොඩනැගිලි කුලී	36,842,474
සනීපාරක්ෂක අවශ්‍යතා	7,360,085
ආරක්ෂක සේවය	2,560,196
	122,156,006

සටහන් 08

වෙනත් මෙහෙයුම් වියදම්	රු.
ප්‍රවාහන	35,221,983
මෙහෙයුම් කල්බදු කුළී	2,333,986
වෙනත් (සුළු මුදල් වියදම්, පත්තර හා අනෙකුත් වියදම්)	4,390,036
	41,946,006

සටහන් 09

ක්ෂයවීම්	රු.
ක්ෂය - ගොඩනැගිලි	45,509,378
ක්ෂය - මෝටර් රථ	29,929,090
ක්ෂය - පරිගණක හා උපාංග	20,740,570
ක්ෂය - ගොඩනැගිලි කාමර බෙදා වෙන් කිරීම	838,042
ක්ෂය - ලී බඩු, සවිකිරීම් හා කාර්යාල උපකරණ	15,805,289
ක්ෂය - යන්ත්‍ර සූත්‍ර හා වෙනත් උපකරණ	10,368,284
ක්ෂය - වත්කම් කළමනාකරණ මෘදුකාංග	75,000
	123,265,653

පුනරුත්ථාපන කාර්යාංශය

2023 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සඳහා සටහන්

සටහන් 10

දේපළ පිරියත හා උපකරණ	2023.01.01 දිනට ශේෂය	අත්පත් කර ගැනීම්	ගැලපුම්	බැහැර කිරීම්	2023.12.31 දිනට ශේෂය
පිරිවැය					
ගොඩනැගිලි	1,237,697,346	29,493,484	(355,196,232)	-	911,994,597
මෝටර් රථ	77,857,282	1,141,440	41,003,000	-	120,001,722
පරිගණක හා උපාංග	15,403,111	9,933,699	66,970,627	-	92,307,437
ගොඩනැඟිලි කාමර බෙදා වෙන් කිරීම්	-	-	8,380,420	-	8,380,420
ලීබඩු, සවි කිරීම් හා කාර්යාල උපකරණ	45,279,521	1,422,086	112,257,799	-	158,959,406
යන්ත්‍ර සූත්‍ර හා වෙනත් උපකරණ	22,588,046	2,505,879	79,630,216	-	104,724,141
වත්කම් කළමනාකරණ මෘදුකාංගය	750,000	-	-	-	750,000
මුළු වටිනාකම	**1,399,575,306**	**44,496,587**	**(46,954,169)**	**-**	**1,397,117,724**

	2023.01.01 දිනට ශේෂය	කාලපරිච්ඡේද සඳහා ක්ෂය	ගැලපුම්	බැහැර කිරීම් සඳහා අදාළ ක්ෂය	2023.12.31 දිනට ශේෂය
ක්ෂය වීම්					
සමුච්චිත ක්ෂය - ගොඩනැගිලි	-	45,509,378	-	-	45,509,378
සමුච්චිත ක්ෂය - මෝටර් රථ	-	29,929,090	-	-	29,929,090
සමුච්චිත ක්ෂය - පරිගණක හා උපාංග	-	20,740,570	-	-	20,740,570
සමුච්චිත ක්ෂය - ගොඩනැගිලි කාමර බෙදා වෙන් කිරීම	-	838,042	-	-	838,042
සමුච්චිත ක්ෂය - ලීබඩු, සවි කිරීම් හා කාර්යාල උපකරණ	-	15,805,289	-	-	15,805,289
සමුච්චිත ක්ෂය - යන්ත්‍ර සූත්‍ර හා වෙනත් උපකරණ	-	10,368,284	-	-	10,368,284
සමුච්චිත ක්ෂය - වත්කම් කළමනාකරණ මාදුකාංගය	-	75,000	-	-	75,000
මුළු වටිනාකම	**-**	**123,265,653**	**-**	**-**	**123,265,653**
ශුද්ධ පොත් අගය	**1,399,575,306**				**1,273,852,070**

සටහන් 11

	2023.01.01 දිනට ශේෂය	අත්පත් කර ගැනීම්	ගැලපුම්	කාලච්ඡේදය තුළ ප්‍රාග්ධනිත කිරීම්	2023.12.31 දිනට ශේෂය
සිදුවෙමින් පවතින ප්‍රාග්ධන වැඩ	135,419,453	34,671,940	(19,754,373)		150,337,020
	135,419,453	**34,671,940**	**(19,754,373)**		**150,337,020**
මුළු එකතුව	**1,534,994,759**				**1,424,189,091**

පුනරුත්ථාපන කාර්යාංශය විසින් පරිහරණය කරනු ලබන ඉඩම් පිළිබඳ හෙළිදරව් කිරීම්

කන්දකාඩු ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය

කන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථානය පිහිටා ඇත්තේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සිංහපුර අක්කර 73 ක භූමි ප්‍රදේශයකය. එය 2017.12.18 වන දින එවකට සිටි නියෝජ්‍ය පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් වෙත පවරා දී ඇත. මෙම ඉඩම කාර්යාංශය වෙත පුනරුත්ථාපන කටයුතු සඳහා පමණක් භාවිතා කිරීමට පවරා දී ඇති අතර, ඒ සඳහා කාර්යාංශය නමින් හිමිකම් ඔප්පුවක් නොමැත.

සේනපුර තෘතියික හා වෘත්තිය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය

සේනපුර පුනරුත්ථාපන මධ්‍යස්ථානය පිහිටා ඇත්තේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ 266 නවසේනපුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පිහිටි අක්කර 3.5056 ක භූමි ප්‍රදේශයකය. මෙම ඉඩම කාර්යාංශය වෙත පුනරුත්ථාපන කටයුතු සඳහා පමණක් භාවිතා කිරීමට මහවැලි අධිකාරිය විසින් පවරා දී ඇති අතර, ඒ සඳහා කාර්යාංශය නමින් හිමිකම් ඔප්පුවක් නොමැත.

වව්නියාව ඒකාබද්ධතා පුනරුත්ථාපන මධ්‍යස්ථානය

වව්නියාව පුනරුත්ථාපන මධ්‍යස්ථානය පිහිටා ඇත්තේ වව්නියාව දිස්ත්‍රික්කයේ පූන්තෝට්ටම්හි පිහිටි සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් සමුපකාර පුහුණු මධ්‍යස්ථානය තුළයි.

මඩකලපුව පිහිටි ඉඩම

නැගෙනහිර පළාතේ මඩකලපුව මන්මුණේ උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තිරණමඩු 173ඊ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පිහිටි හෙක්ටයාර 0.1012 ක ඉඩම මන්මුණේ උතුර ප්‍රාදේශීය ලේකම් විසින් 2019 නොවැම්බර් 14 වන දින පුනරුත්ථාපන කාර්යාංශය වෙත පවරා දී ඇත.

පුනරුත්ථාපනය වූවන්ගේ ආර්ථික, සමාජයීය හා සුභ සාධන කටයුතු සම්බන්ධීකරණ කාර්යාලය - මහනුවර

හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2022.04.07 වන දින ගොහාගොඩ ජයන්ති පාසල සතු ඉඩම පුනරුත්ථාපන කාර්යාංශය වෙත පවරා දී ඇත. මෙම පරිශ්‍රයේ පිහිටි කාර්යාලය මගින් පසුවිපරම් කටයුතු සිදු කරනු ලැබේ.

අනුරාධපුර පිහිටි ඉඩම

මහවැලි අධිකාරිය විසින් උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් 342 පහමුණේගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ අන්දරේ වැව ග්‍රාමයේ පිහිටි හෙක්ටයාර 2.7631 ක ඉඩම පුනරුත්ථාපන කාර්යාංශය වෙත පවරා දී ඇත.

පුනරුත්ථාපනය වූවන්ගේ ආර්ථික, සමාජයීය හා සුභසාධන කටයුතු සම්බන්ධීකරණ කාර්යාලය, කුරුණෑගල

පුනරුත්ථාපනලාභීන් සඳහා වන සමාජ, ආර්ථික හා සුභසාධන කටයුතු සම්බන්ධීකරණ කාර්යාලය, කුරුණෑගල අක්කර 01, රූඩ් 01, පර්චස් 17 ක් වන භූමි ප්‍රදේශයක පිහිටා ඇත. එහි මීට පෙර වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කු/සැවැන්දන මුණසිංහ පාසල පවත්වාගෙන ගොස් තිබේ. මෙහි විධිමත් පවරා ගැනීම් කටයුතු ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව හරහා මේ වනවිටත් සිදු කෙරෙමින් පවතී.

පුනරුත්ථාපන කාර්යාංශයට අයත් මෝටර් රථ පිළිබඳව හෙළිදරව් කිරීම

2015 වර්ෂයේ සිට පුනරුත්ථාපන කාර්යාංශය සතුව පැවති මෝටර් රථ 02 ක් ධාවනයට සුදුසු තත්ත්වයේ නොපැවතීම හේතුවෙන් 2023 වර්ෂය තුළදී ධාවනයෙන් ඉවත් කර පැවතුණි. 2023 වර්ෂය අවසානයේදී අධිකරණ

අමාත්‍යාංශය විසින් පත්කළ කමිටුව මගින් එම මෝටර් රථ දෙක අළුත්වැඩියා කොට ධාවනයට සුදුසු තත්ත්වයට පත් කිරීමට නිර්දේශ කරන ලදී. 2024 වර්ෂය ආරම්භයේදී එම වාහන අළුත්වැඩියා කරන ලද අතර, 2024.01.03 වන දින රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් රක්ෂණය සඳහා තක්සේරු වටිනාකම් ලබා ගන්නා ලදී. එහි විස්තර පහත පරිදි වේ.

වාහන අංකය	වාහන වර්ගය
පීබී-7843	මයික්‍රෝ කැබ්
කේඅයි- 5895	ජීප්

ඉහත වාහන සඳහා 2024.01.03 දින තක්සේරු වටිනාකම් ලබා ගත් අතර ඒවා 2023 වර්ෂය තුළදී හා ඊට පෙර වසර කිහිපයක් තුළ ධාවනයට සුදුසු තත්ත්වයේ නොපැවති බැවින් එම මෝටර් රථවල වටිනාකම ජංගම නොවන වත්කම් වල ඇතුළත් නොවන අතර ක්ෂයවීම් සඳහා නොසලකා හැර ඇත.

සටහන් 12	**2023**
තොගය	**රු.**
ලිපිද්‍රව්‍ය	8,885,279
ඉන්ධන	622,285
සලාක	340,895
සුබසාධක ද්‍රව්‍ය	6,699,078
මූලික අවශ්‍යතා ද්‍රව්‍ය	29,161,063
පරිභෝජන ද්‍රව්‍ය	7,739,329
ක්‍රීඩා හා විනෝදාත්මක	441,500
	53,889,429

සටහන් 13	**2023**
පෙර ගෙවීම්	**රු.**
නඩත්තු ගිවිසුම් (ඡායා පිටපත් යන්ත්‍ර)	289,677
රක්ෂණය	843,310
	1,132,987

	2023
සටහන් 14	**රු.**
මුදල් හා මුදල් සමාන දෑ	
ලංකා බැංකුව - බොරැල්ල සුපිරි ශාඛාව (0007042763)	2,293,254
සුළු මුදල් අග්‍රිමය	-
	2,293,254

සටහන් 15	2023
ප්‍රතිපාදන හා වෙනත් ගෙවිය යුතු දෑ	රු.
ගෙවිය යුතු ගමන් වියදම් - දේශීය	62,298
ගෙවිය යුතු ලිපිද්‍රව්‍ය වියදම්	34,155
ගෙවිය යුතු ඉන්ධන වියදම්	9,254,049
ගෙවිය යුතු මෝටර් රථ නඩත්තු වියදම්	294,315
ගෙවිය යුතු ගොඩනැගිලි නඩත්තු	-
ගෙවිය යුතු උපකරණ නඩත්තු	47,380
ගෙවිය යුතු සලාක	33,972,332
ගෙවිය යුතු සුබසාධන ද්‍රව්‍ය නිකුත් කිරීම්	533,618
ගෙවිය යුතු ප්‍රවාහන බිල්පත්	5,032,249
ගෙවිය යුතු දුරකථන ගාස්තු	353,936
ගෙවිය යුතු විදුලි හා ජල ගාස්තු	3,914,260
ගෙවිය යුතු තැපැල් ගාස්තු	-
ගෙවිය යුතු ගොඩනැගිලි කුළිය	28,000
ගෙවිය යුතු සනීපාරක්ෂක අවශ්‍යතා	560,306
ගෙවිය යුතු ආරක්ෂක සේවා ගාස්තු	196,075
ගෙවිය යුතු වෙනත් වියදම්	102,744
ගෙවිය යුතු මූලික අවශ්‍යතා නිකුත් කිරීම	-
ගෙවිය යුතු ගොඩනැගිලි ඉදිකිරීම් බිල්පත්	-
ගෙවිය යුතු රඳවාගැනීම්	313,801
ගෙවිය යුතු පුහුණු බිල්පත්	1,590,144
ගෙවිය යුතු පසුවිපරම් බිල්පත්	30,000
ගෙවිය යුතු සභාපතිතුමාගේ හා සභාවේ දීමනා	263,170
ගෙවිය යුතු විශේෂ දීමනා	5,746,031
ගෙවිය යුතු වැටුප් හා වේතන	1,999,061
ගෙවිය යුතු වෙනත් දීමනා	709,142
ගෙවිය යුතු අතිකාල දීමනා	132,802
ගෙවිය යුතු විගණන කමිටු සහභාගිත්ව හා ප්‍රවාහන දීමනාව	30,000
	65,199,870

හෙළිදරව් කිරීම්

	රු.
ගොඩනැගිලි සඳහා තැන්පතු	**7,690,560**

මෙය පුනරුත්ථාපන කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලය පිහිටි ගොඩනැගිල්ල සඳහා බී.එස්.එම්. හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම වෙත 2021 අප්‍රේල් මාසයේදී සිදුකළ ගෙවීමකි. මෙම වටිනාකම මාසික කුලිය වන රු.2,563,520 බැගින් වූ මාස 03 ක කුලී මුදලට සමාන වේ. එය කාර්යාංශය වෙත කුලී ගිවිසුම අවසානයේ එනම් 2024.03.31 දිනට ගෙවා පියවීමට හෝ අමාත්‍ය මණ්ඩල අනුමැතියේ සඳහන් නියෝග ප්‍රකාරව තවත් කාලච්ඡේදයක් සඳහා පවත්වාගෙන යාමට හැකි වේ.

සටහන් 16	2023
සමුච්චිත ප්‍රාග්ධන ප්‍රදාන	රු.
2023.01.01 දිනට ආරම්භක ශේෂය	1,542,285,013
වත්කම් වටිනාකම නිවැරදි කිරීම	(61,911,543)
2023.12.31 දිනට අවසාන ශේෂය	**1,480,373,470**

හෙළිදරව් කිරීම්

කන්දකාඩු සිංහපුර බඩ ඉරිඟු ව්‍යාපෘතිය

2022 සහ 2023 වර්ෂ තුළදී පුනරුත්ථාපන කාර්යාංශය කෘෂිකර්ම අමාත්‍යාංශයේ මූල්‍ය හා සහිතව බඩ ඉරිඟු වගා ව්‍යාපෘතියක් සිදු කරන ලදී. කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් සිදු කරන ලද ප්‍රතිපාදන මාරු කිරීම් හා කාර්යාංශය විසින් දරන ලද වියදම් විස්තර පහත පරිදි වේ.

2022 වර්ෂය සඳහා	රු.	රු.
වැය ශීර්ෂය 118-02-26-004 (2509)		
කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ප්‍රතිපාදන මාරුකිරීම්		39,546,017
කාර්යාංශය විසින් දරන ලද වියදම්		
5KVA ජෙනරේටරය	540,000	
බීජ සිටුවීමේ යන්ත්‍රය	719,000	
විද්‍යුත් වතුර මෝටරය	258,065	
හියුම් පයිප්ප	297,275	
ඇල්කතින් බට	506,345	(2,320,685)
2022.12.31 දිනට මහා භාණ්ඩාගාරය වෙත හරවා යැවූ ඉතිරි ප්‍රතිපාදන		37,225,332

2023 වර්ෂය සඳහා		
වැය ශීර්ෂය 118-02-03-79-2202		
කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ප්‍රතිපාදන මාරු කිරීම්		10,669,110
කාර්යාංශය විසින් දරන ලද වියදම්		
කෘමිනාශක	319,000	
කෘමිනාශන උගුල්	472,501	
කොකු නගුල	220,170	
තැටි නගුල	416,970	
ට්‍රැක්ටර් රොටරි නගුල	724,470	
බඩ ඉරිඟු බීජ	2,000,000	(4,153,110)
පොහොර	6,516,000	(6,516,000)
2023.12.31 දිනට මහා භාණ්ඩාගාරය වෙත නැවත හරවා යැවූ ඉතිරි ප්‍රතිපාදන		-

ඉහත ප්‍රතිපාදන මගින් ලද වත්කම් කාර්යාංශය විසින් පරිහරණය කරනු ලබන බැවින් කාර්යාංශය සතු වත්කම් ලෙස හඳුනාගෙන ඇත. 2022 වර්ෂය තුළදී මිලදී ගත් වත්කම් හා තොග අයිතම සමුච්චිත ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම හරහා හඳුනාගෙන ඇත. 2023 වර්ෂය තුළදී මිලදීගත් වත්කම් හා තොග අයිතම 2023 වර්ෂය තුළදී ලැබීම් ලෙස හඳුනාගෙන ඇත.

මෝටර් රථ යටතේ හඳුනාගත් වත්කම් (2023)	**රු.**
වැය ශීර්ෂය 118-02-03-79-2202	
තැටි නගුල	416,970
ට්‍රැක්ටර් රොටරි නගුල	724,470
	1,141,440

යන්ත්‍ර සූත්‍ර හා වෙනත් උපකරණ යටතේ හඳුනාගත් වත්කම් (2022)	
වැය ශීර්ෂය 118-02-26-004 (2509)	
5KVA ජෙනරේටරය	540,000
බීජ සිටුවීමේ යන්ත්‍රය	719,000
විද්‍යුත් වතුර මෝටරය	258,065
	1,517,065

2023 වර්ෂය සඳහා අයවැයගත වියදම හා සත්‍ය වියදම සැසඳුම

විෂය පථය	අනුමත අයවැය ඇස්තමේන්තුව (රු.)	සංශෝධිත අයවැය ඇස්තමේන්තුව (රු.)	සත්‍ය වියදම 2023.12.31 දිනට	ඉතිරිය	මූල්‍ය ප්‍රගතිය %	භෞතික ප්‍රගතිය %
පුනරාවර්තන වියදම් 110-01-07-01-1503 **පුද්ගල පඩිනඩි**						
වැටුප් හා දීමනා	34,609,594	34,609,594	29,871,698	4,737,895	86	86
වෙනත් දීමනා	13,005,300	13,005,300	11,869,968	1,135,332	91	91
අතිකාල	4,212,744	4,212,744	1,821,455	2,391,289	43	43
විශේෂ දීමනා	73,172,362	73,172,362	66,010,995	7,161,367	90	90
පුනරාවර්තන එකතුව	**125,000,000**	**125,000,000**	**109,574,116**	**15,425,884**	**88**	**88**
පුනරාවර්තන වියදම් 110-01-07-01-1509 **වෙනත් මෙහෙයුම් වියදම්**						
ගමන් වියදම් දේශීය	2,910,000	1,410,000	835,558	574,442	59	59
ලිපිද්‍රව්‍ය	14,815,950	14,815,950	10,259,406	4,556,544	69	69
ඉන්ධන	80,376,028	97,876,028	87,148,560	10,727,468	89	91
වාහන නඩත්තු	8,000,000	17,000,000	16,980,102	19,898	100	100
ගොඩනැගිලි නඩත්තු	2,000,000	2,000,000	1,999,167	833	100	100
උපකරණ නඩත්තු	2,000,000	6,400,000	6,307,463	92,537	99	99
සලාක	296,812,500	187,312,500	142,514,317	44,798,183	76	88
සුභසාධක ද්‍රව්‍ය	13,076,000	13,076,000	10,841,148	2,234,852	83	83
ප්‍රවාහන වියදම්	54,259,988	44,259,988	36,226,686	8,033,302	82	82
දුරකතන	3,620,400	3,820,400	3,759,216	61,184	98	98
විදුලිය හා ජලය	28,440,000	40,840,000	39,580,354	1,259,646	97	97
තැපැල් වියදම්	288,000	288,000	120,000	168,000	42	42
ගොඩනැගිලි කුලි	31,290,240	39,790,240	39,619,838	170,402	100	100
සනීපාරක්ෂක වියදම්	15,043,000	11,043,000	8,342,425	2,700,575	76	76
ක්‍රීඩා හා විනෝදාත්මක	1,038,294	1,038,294	21,160	1,017,134	2	2

විෂය පථය	අනුමත අයවැය ඇස්තමේන්තුව (රු.)	සංශෝධිත අයවැය ඇස්තමේන්තුව (රු.)	සත්‍ය වියදම 2023.12.31 දිනට	ඉතිරිය	මූල්‍ය ප්‍රගතිය %	භෞතික ප්‍රගතිය %
ආරක්ෂක සේවා	2,649,600	2,649,600	2,590,582	59,018	98	98
වෙනත් වියදම්(සුළු මුදල්,පත්තර හා වෙනත් වියදම්)	7,380,000	5,380,000	4,064,573	1,315,427	76	76
පුනරාවර්තන එකතුව	**564,000,000**	**489,000,000**	**411,210,558**	**77,789,442**	**84**	**89**

ප්‍රාග්ධන වියදම 110-01-07-01-2202
ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම

පුහුණු හා සංවර්ධන	50,200,000	49,200,000	25,816,221	23,383,779	52	79
පසුවිපරම් කටයුතු	2,500,000	3,500,000	3,208,351	291,649	92	100
මූලික නිකුත් කිරීම්	82,772,800	65,672,800	49,240,738	16,432,062	75	75
පොදු අවශ්‍යතා	8,960,872	17,360,872	9,851,032	7,509,840	57	57
කාර්යාල උපකරණ	4,069,625	12,769,625	11,918,861	850,764	93	93
ගොඩනැගිලි ඉදිකිරීම්	151,496,703	151,496,703	70,407,959	81,088,744	46	78
ප්‍රාග්ධන එකතුව	**300,000,000**	**300,000,000**	**170,443,163**	**129,556,837**	**57**	**80**
මුළු එකතුව	**989,000,000**	**914,000,000**	**691,227,837**	**222,772,163**	**76**	

සටහන්

අයවැයගත වියදම හා සත්‍ය වියදම සැසඳුම මුදල් පදනම මත සිදු කර ඇත.

පුනරුත්ථාපන කාර්යාංශ - මූල්‍ය ප්‍රකාශන

2023 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

1. සංස්ථාපිත තොරතුරු

1.2 නිත්‍යවාසය හා නෛතික ස්වරූපය

පුනරුත්ථාපන කාර්යාංශය සිය මෙහෙයුම් කටයුතු 2008 වර්ෂයේදී ආරම්භ කරන ලදී. 2008 වර්ෂයේ සිට 2022 වර්ෂය තෙක් එයට අදාළ රේඛීය අමාත්‍යාංශය යටතේ විශේෂ ව්‍යාපෘතියක්/ උප කාර්යාලයක් ලෙස මෙහෙයවන ලදී.

2023 වර්ෂයේදී පුනරුත්ථාපන කාර්යාංශය 2023 අංක 02 දරන පුනරුත්ථාපන කාර්යාංශ පනතේ විධිවිධාන අනුව අධිකරණ අමාත්‍යාංශය යටතේ සංස්ථාපිත මණ්ඩලයක් ලෙස පිහිටුවන ලදී.

ලියාපදිංචි කාර්යාලය හා කාර්යාංශයේ කටයුතු මෙහෙයවන ප්‍රධාන ස්ථානයේ ලිපිනය
අංක 462/2, කඩුවෙල පාර, ගනහේන,බත්තරමුල්ල.

කාර්යාංශයේ ප්‍රධාන මධ්‍යස්ථාන

1. නවෝදාව ප්‍රතිකාර මධ්‍යස්ථානය - කන්දකාඩු
2. නවෝදාව තෘතිය හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය - සේනපුර
3. ඒකාබද්ධතා මධ්‍යස්ථානය - වව්නියාව

ප්‍රාදේශීය සම්බන්ධීකරණ කාර්යාල

1. පුනරුත්ථාපනය වූවන්ගේ ආර්ථික සාමාජීය හා සුබ සාධන කටයුතු සම්බන්ධීකරණ කාර්යාලය, කොළඹ I, දෙහිවල
2. පුනරුත්ථාපනය වූවන්ගේ ආර්ථික සාමාජීය හා සුබ සාධන කටයුතු සම්බන්ධීකරණ කාර්යාලය, කොළඹ II , දෙහිවල
3. පුනරුත්ථාපනය වූවන්ගේ ආර්ථික සාමාජීය හා සුබ සාධන කටයුතු සම්බන්ධීකරණ කාර්යාලය, ගම්පහ
4. පුනරුත්ථාපනය වූවන්ගේ ආර්ථික සාමාජීය හා සුබ සාධන කටයුතු සම්බන්ධීකරණ කාර්යාලය, කුරුණෑගල
5. පුනරුත්ථාපනය වූවන්ගේ ආර්ථික සාමාජීය හා සුභ සාධන කටයුතු සම්බන්ධීකරණ කාර්යාලය, පුත්තලම
6. පුනරුත්ථාපනය වූවන්ගේ ආර්ථික සාමාජීය හා සුබ සාධන කටයුතු සම්බන්ධීකරණ කාර්යාලය, අනුරාධපුර
7. පුනරුත්ථාපනය වූවන්ගේ ආර්ථික සාමාජීය හා සුබ සාධන කටයුතු සම්බන්ධීකරණ කාර්යාලය, ගාල්ල
8. පුනරුත්ථාපනය වූවන්ගේ ආර්ථික සාමාජීය හා සුභ සාධන කටයුතු සම්බන්ධීකරණ කාර්යාලය, මහනුවර
9. පුනරුත්ථාපනය වූවන්ගේ ආර්ථික සාමාජීය හා සුබ සාධන කටයුතු සම්බන්ධීකරණ කාර්යාලය, හම්බන්තොට
10. පුනරුත්ථාපනය වූවන්ගේ ආර්ථික සාමාජීය හා සුබ සාධන කටයුතු සම්බන්ධීකරණ කාර්යාලය, පොළොන්නරුව
11. පුනරුත්ථාපනය වූවන්ගේ ආර්ථික සාමාජීය හා සුබ සාධන කටයුතු සම්බන්ධීකරණ කාර්යාලය, කළුතර
12. පුනරුත්ථාපනය වූවන්ගේ ආර්ථික සාමාජීය හා සුබ සාධන කටයුතු සම්බන්ධීකරණ කාර්යාලය, මඩකලපුව
13. පුනරුත්ථාපනය වූවන්ගේ ආර්ථික සාමාජීය හා සුබ සාධන කටයුතු සම්බන්ධීකරණ කාර්යාලය, යාපනය

1.3 මූලික කටයුතු හා මෙහෙයුම් කටයුතු වල ස්වභාවය

කාර්යාංශයේ මූලික කටයුතු සෑම වසරකම වසර පුරා සිදුකරනු ලබන පහත කාර්යයන්ගෙන් සමන්විත වේ.

i. පුනරුත්ථාපනලාභීන්ගේ ආර්ථික, සාමාජීය හා අධ්‍යාපන මට්ටම අනුව යුධ මානසිකත්වයෙන් හා මත්ද්‍රව්‍ය භාවිතයෙන් ඈත්වීම සඳහා සහය වීම, මනෝ විද්‍යාත්මක ප්‍රතිකාර ක්‍රම තුළින් චර්යාත්මක වෙනසකට භාජනය කිරීම.

ii. ඔවුන්ගේ ජීවන වටපිටාව හා වාතාවරණය වෙනස් කිරීම තුළින් සටන්කාමීත්වය හා මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීමෙන් මොවුන් මුදවා ගැනීම.

iii සමාජගත වීමෙන් පසු රැකියා අවස්ථාවන් උදාකර ගැනීමට හැකිවන පරිදි වෘත්තීය දැනුම ලබා දීම.

iv පවුල් සංස්ථාව ශක්තිමත් කිරීම, එහි වැදගත්කම, ද්විපාර්ශවීය වගකීම් අවබෝධ කරදීම හා පවුල් සංස්ථාව පවත්වා ගෙනයාම සඳහා වූ ආර්ථික, සමාජීය හා සුභසාධන කටයුතු නගාසිටු වීම.

1.4 නිකුත් කිරීම සඳහා බලයලත් දිනය

පුනරුත්ථාපන කාර්යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සකස් කළ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය ලබා දීම 2024 පෙබරවාරි මස 19 වන දින පැවති පාලක සභා රැස්වීම් තීරණයට අනුව සිදු විය.

1.5 සේවක සංඛ්‍යාව

වර්ෂය අවසානයේ කාර්යාංශයේ සේවයේ නියුතු සේවක සංඛ්‍යාව 665 කි. (ත්‍රිවිධ හමුදා 592, සිවිල් 73) (2022 වර්ෂයේදී - 675, ත්‍රිවිධ හමුදා 594 සහ සිවිල් 81)

1.6 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශනය

පුනරුත්ථාපන කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙළ කර ඇත.

පුනරුත්ථාපන කාර්යාංශය ප්‍රථම වතාවට ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව 2023 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කොට ඇත.

1.7 පාලක සභාවේ වගකීම පිළිබඳ ප්‍රකාශනය

සභාපති ප්‍රමුඛ පාලක සභාවේ සාමාජිකයින් විසින් කාර්යාංශයේ ආදායම් සහ වියදම් ,වත්කම් සහ වගකීම් සහ කාර්යාංශයේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතුයි. සභාව විසින් , විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය විගණකවරයාගේ වාර්තාව සමග එකී වාර්තාව අදාළ වන මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු දින එකසිය පනහක් ඇතුළත අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. අමාත්‍යවරයා විසින් එකී ප්‍රකාශය සහ වාර්තාව ලැබීමෙන් පසු මාස දෙකක් ඇතුළත ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම සභාව සතු වගකීමකි.

2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1 පිළියෙල කිරීමේ පදනම

මුල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව අතීත පිරිවැය පදනම් කර ගෙන පිළියෙල කර ඇත.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති යටතේ මුල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී නිශ්චිත ඉතා වැදගත් ගිණුම්කරණ ඇස්තමේන්තු අවශ්‍ය වේ. කාර්යාංශයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ කර ගැනීමේ ක්‍රියාවලියේදී කළමනාකරණය විසින් විචාර බුද්ධිය මත තීරණ ගැනීමට සිදු වේ. ඉහළ මට්ටමක තීරණ ගත යුතු අවස්ථා හෝ සංකීර්ණ බවෙන් යුතු හෝ උපකල්පන හා ඇස්තමේන්තු මුල්‍ය ප්‍රකාශන වලට ඉතා වැදගත් වන අවස්ථා සටහන් අංක 10 හා 11 හිදී හෙළිදරව් කර ඇත.

2.2 අඛණ්ඩ පැවැත්ම

සභාව විසින් කාර්යාංශය අඛණ්ඩ පැවැත්මක් සහ දැකිය හැකි අනාගත කාල පරිච්ඡේදයක් සඳහා අඛණ්ඩව මෙහෙයුම් පවත්වා ගෙන යා හැකි බවට තක්සේරු කර ඇත. කළමනාකාරිත්වයේ දැකීම අනුව කාර්යාංශයට දැකිය හැකි අනාගත කාල පරිච්ඡේදයක් සඳහා අඛණ්ඩව ක්‍රියාත්මක වීමට අවශ්‍ය තරම් ප්‍රමාණවත් සම්පත් හා සහාය ඇත. මුල්‍ය ප්‍රකාශන අඛණ්ඩව පැවැත්ම පදනම් කොට ගෙන පිළියෙල කර ඇත.

2.3 ප්‍රමාණාත්මකභාවය හා සමාහරණය

වත්කම් සහ වගකීම් ඒවායේ ස්වභාවය අනුව සහ ඒවායේ සාපේක්ෂ ද්‍රවශීලතාවය පිළිඹිබු වන පරිදි ලැයිස්තුගත කර සමාහරණය කර ඇත. ගිණුම්කරණ මූලධර්ම නොවෙනස්ව පවත්වා ගෙන යා යුතු අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල විස්තර කර ඇති පරිදි විශේෂයෙන් හෙළිදරව් කළ යුතු අනෙකුත් අවස්ථාවන්හිදී විචක්ෂණශීලී බව, ප්‍රමාණාත්මක බව හා පැවැත්ම යනාදිය සැලකිල්ලට ගෙන නියමිත පරිදි විශේෂයෙන් හෙළිදරව් කළ යුතුය. ගිණුම්කරණ ප්‍රතිපත්ති අවශ්‍ය පරිදි අනුප්‍රාප්තීය සටහන් මගින් හෙළිදරව් කළ යුතුය.

මුල්‍ය ප්‍රකාශනවල සෑම ප්‍රමාණාත්මක, සමාන අයිතම වෙනමම ඉදිරිපත් කරනු ලබයි. ස්වභාවයෙන් හෝ කාර්යයෙන් වෙනස් අයිතම ප්‍රමාණාත්මක නොවන අවස්ථාවන්හිදී හැර වෙනමම ඉදිරිපත් කරනු ලැබේ.

2.4 ක්‍රියාත්මක හා ඉදිරිපත් කරන මුදල් ඒකකය

මෙම මුල්‍ය ප්‍රකාශන කාර්යාංශයේ ක්‍රියාත්මක මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර සියලුම මුල්‍ය තොරතුරු විශේෂයෙන් සඳහන් කර නොමැති අවස්ථාවල ආසන්නතම රුපියලට වටයා ඇත.

3. වත්කම් හා ඒවා තක්සේරු කිරීමේ පදනම

3.1 දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ පිරිවැය මත හඳුනා ගනු ලබන අතර මූලිකව මිලදී ගත් වටිනාකමෙන් සමුච්චිත ක්ෂය හා යම් හානිකරණ අලාභ වේ නම් ඒවා අඩු කර වාර්තා කළ යුතුය. දේපළ, පිරියත හා උපකරණ යටතේ ගැනෙන අයිතමයක පිරිවැය, ගැනුම් මිල සහ අපේක්ෂිත ආකාරයෙන් වත්කම ක්‍රියාකරවිය හැකි තත්ත්වයට පත් කිරීමට සෘජුව අදාළ කළ හැකි වෙනත් පිරිවැය වලින් සමන්විත වේ.

ඉදිකළ වත්කමක පිරිවැය එම වත්කම අපේක්ෂිත ආකාරයෙන් ක්‍රියාකරවිය හැකි තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය වටිනාකම, සෘජු ශ්‍රමය, අනෙකුත් සෘජු වියදම් වලින් සමන්විත වේ. මෙයට

කොටස් ගලවා ඉවත් කිරීමේ පිරිවැය හා පිහිටි භූමිය තුළ නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමේ පිරිවැය ඇතුළත් වේ.

පසුව දරන වියදම් ප්‍රාග්ධනිත කරනු ලබන්නේ ඒවායෙන් අනාගත ආර්ථික ප්‍රතිපාදන හෝ සේවා ශක්‍යතාවයන් හා බැඳුණු සම්පත් කාර්යාංශය තුළට ගලා ඒම අපේක්ෂා කළ හැකි අවස්ථාවන්හිදී සහ ඒවායේ පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි අවස්ථාවලදී පමණි. අනෙකුත් සියලු සිදු වෙමින් පවතින අළුත්වැඩියා සහ නඩත්තු ඒවා දරන අවස්ථාවේ වියදම් ලෙස හඳුනා ගැනේ.

3.2 පවරා දුන් ඉඩම්වල පිහිටි ගොඩනැගිලි

කාර්යාංශයට පරිහරණය කිරීම සඳහා පමණක් භාර දී ඇති නමුත් නීතීමය අයිතියක් නොමැති ඉඩම්වල, පුනරුත්ථාපන කාර්යාංශයට ලැබුණු රාජ්‍ය අරමුදල් ප්‍රදාන උපයෝගී කොට ගෙන ඉදිකළ ගොඩනැගිලි, දේපළ, පිරියත හා උපකරණ යටතේ ගිණුම් ගත කොට ඇත.

3.3 ක්ෂය වීම්

වත්කමක ක්ෂයවීම එය ප්‍රයෝජනයට ගත හැකි තත්ත්වයට පත්වන විට පටන් ගන්නා අතර එම වත්කම හඳුනා නොගන්නා තත්ත්වයට පත්වන දිනට පෙර නවත්වනු ලැබේ.

පුනරුත්ථාපන කාර්යාංශය මුල්‍ය ප්‍රකාශනවල වත්කම් ප්‍රථම වතාවට 2023 වර්ෂයේදී වාර්තා කළ අතර ක්ෂය වීම් සඳහා ප්‍රථම වර්ෂය ලෙස සැලකේ.

ක්ෂය කිරීම මගින් දේපළ පිරියත හා උපකරණ වල පිරිවැය සරල මාර්ග ක්‍රමය අනුව වත්කමේ ඵලදායී ජීව කාලය පුරා ලියා හැරීම සිදු කෙරේ. මේ සඳහා මූලික වාර්ෂික ප්‍රතිශතයක් මෙසේය.

ගොඩනැගිලි	5%
මෝටර් රථ	25%
පරිගණක හා උපාංග	25%
ගොඩනැගිලි බෙදා වෙන් කිරීම්	10%
ලී බඩු සවි කිරීම් හා කාර්යාල උපකරණ	10%
දේපළ පිරියත හා වෙනත් උපකරණ	10%

අවසාන වාර්තා කළ දින සිට යම් වැදගත් වෙනසක් පිළිබඳ යම් සංඥාවක් ඇත්නම් වත්කම් වල අවශේෂ අගය, ඵලදායී ජීව කාලය හා ක්ෂය ක්‍රමය සමාලෝචනය කර අවශ්‍ය පරිදි ඉදිරි සංශෝධන සිදු කරනු ලැබේ.

වත්කමක ධාරණ අගය අය කරවා ගත හැකි වටිනාකමට වඩා වැඩි නම් එම වත්කමේ ධාරණ අගය අය කරවා ගත හැකි වටිනාකම තෙක් ක්ෂණිකව ලියා හරිනු ලැබේ.

වත්කමක ධාරණ අගය හා වත්කමක් අපහරණය කිරීමෙන් ලද මුදල් සැසඳීම මගින් ලාභය හෝ අලාභය තීරණය වන අතර එය මුල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ "විවිධ ආදායම්"ලෙස හඳුනා ගැනේ.

හඳුනා ගැනීම ඉවත් කිරීම

වත්කම අපහරණයේදී, හෝ පරිහරණය කිරීමෙන් හෝ අපහරණය කිරීමෙන් අනාගත ආර්ථික වාසි සලසා ගත නොහැකි අවස්ථාවලදී දේපළ"පිරියත හා උපකරණ අයිතමයක ධාරණ අගය හඳුනා ගැනීම සිදු නොකරයි. දේපළ පිරියත හා උපකරණවල ධාරණ අගය අපහරණය කිරීමෙන් ලද මුදල සැසඳීමෙන් වත්කම් හඳුනා ගැනීම ඉවත් කිරීමෙන් ලද ලාභය හෝ අලාභය තීරණය වේ. එහිදී ලැබෙන ශුද්ධ වටිනාකම මුල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ "විවිධ ආදායම්"තුළ ඇතුළත් වේ.

3.4 සිදු වෙමින් පවතින ප්‍රාග්ධන වැඩ

සිදු වෙමින් පවතින ප්‍රග්ධන වැඩ තුළ අමුද්‍රව්‍ය පිරිවැය, ශ්‍රම පිරිවැය හා ගොඩනැගිලි, වැට හා අනෙකුත් ඉදිකිරීම් සඳහා දරනු ලබන අනෙකුත් වියදම් ඇතුළත් වේ. දරනු ලබන සියලු වියදම් සිදු වෙමින් පවතින ප්‍රග්ධන වැඩ තුළ රැස් කොට අදාළ කාර්යය සම්පූර්ණ වූ පසු එම වියදම අදාළ වත්කම් ගිණුමට මාරු කරනු ලැබේ. වත්කම ප්‍රග්ධනිත කරන තුරු ක්ෂයවීම් ගණනය කරනු නොලැබේ.

3.5 අස්පෘශ්‍ය වත්කම්

පරිගණක මෘදුකාංග

අස්පෘශ්‍ය වත්කමක් යනු හඳුනාගත හැකි භෞතික පැවැත්මක් නොමැති මුල්‍ය නොවන වත්කමකි.

අස්පෘශ්‍ය වත්කමක් මූලිකව පිරිවැය මත හඳුනා ගනු ලබන අතර පසුව පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය හා සමුච්චිත අගය අඩුවීම් අලාභ අඩු කළ පසු ලැබෙන අගය මත හඳුනා ගනු ලැබේ. සියලුම පර්යේෂණ හා සංවර්ධන වියදම් වෙනත් වත්කමක කොටසක් ලෙස හඳුනා ගත නොහැකි විට වියදම් ලෙස හඳුනා ගැනේ.

අස්පෘශ්‍ය වත්කම් ක්‍රම ක්ෂය මගින් සරල මාර්ග ක්‍රමය මත පහත පරිදි ලියා හරිනු ලැබේ.

පරිගණක මෘදුකාංග	**වසර 10**

අස්පෘශ්‍ය වත්කමක අවශේෂ වටිනාකම, ඵලදායි ජීව කාලය හෝ ක්‍රම ක්ෂය අනුපාතයේ යම් වැදගත් වෙනසක් පිළිබඳ ඇඟවීමක් ඇත්නම් අනාගත අපේක්ෂාවෙන් පිළිඹිබු වන පරිදි ක්‍රම ක්ෂය ඉදිරි ගැලපුම් සඳහා සංශෝධනය කළ යුතුය.

3.6 තොග

තොගය, සනීපාරක්ෂක අයිතම, ලිපිද්‍රව්‍ය, මූලික නිකුත් කිරීම්, සුබ සාධක නිකුත් කිරීම් ජෙනරේටරය සඳහා ඉන්ධන හා සලාක තොග වලින් සමන්විත වේ. මෙම අයිතම නැවත විකිණීම සඳහා නොවන අතර කාර්යාංශයේ ප්‍රයෝජනය සඳහා පවතී. එහි ප්‍රතිඵලයක් ලෙස තොගය පිරිවැය මත අගය කරනු ලබන අතර ශුද්ධ උපලබ්ධි අගය සලකා බලනු නොලැබේ. තොගයේ පිරිවැය ප්‍රථමයෙන් ලැබීම් ප්‍රථමයෙන් නිකුත් කිරීමේ ක්‍රමය (ප්‍ර.ලැ.ප්‍ර.නි) මත පදනම්ව ගණනය කරනු ලැබේ.

3.7 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් සමාන දෑ ප්‍රධාන වශයෙන් බැංකුවේ ගිණුම් ශේෂයෙන් සමන්විත වේ.

4. ගෙවිය යුතු දෑ සහ උපචිත වියදම්

ගෙවිය යුතු දෑ පිරිවැය මත පෙන්වා ඇත.

4.1 ප්‍රතිපාදන අසම්භාව්‍ය වත්කම් හා වගකීම්

පුනරුත්ථාපන කාර්යාංශය ප්‍රතිපාදනයන් හඳුනා ගනු ලබන්නේ අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් අස්ථිත්වයකට ප්‍රවර්තන බැඳීමක් (නෛතික හෝ සම්මුතික) පවතින විටෙක, එම බැඳීම පියවීම පිණිස ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා හැකියාවන් සහිත සම්පත් පිටතට ගලා යාම අවශ්‍ය වීම හව්‍ය වන විටෙක සහ බැඳීමේ ප්‍රමාණයෙහි විශ්වාසදායි ඇස්තමේන්තුවක් කළ හැකි විටෙකදීය.

ප්‍රතිපාදන මනිනු ලබන්නේ ප්‍රවර්තන බැඳීම පියවීමට අවශ්‍ය ඇස්තමේන්තුගත වියදම මත, එය ප්‍රවර්තන බැඳීම ආශ්‍රිතව පවතින අවදානම හා අවිනිශ්චිතභාවය ඇතුළුව වාර්තා කරන දිනට පවතින වඩාත් විශ්වාසනීය සාක්ෂි මත පදනම් වේ.

ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා හැකියාවන් සහිත සම්පත් පිටතට ගලායෑමේ භව්‍යතාවය විරළ වන්නේ නම් හැර සියලුම අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ලෙස හෙළිදරව් කරනු ලැබේ.

ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා ශක්‍යතාවයන් ගලා ඒමක් භව්‍ය වන විට අසම්භාව්‍ය වත්කමක් හෙළිදරව් කෙරේ.

5. හුවමාරු නොවන ගණුදෙනු වලින් වන අයභාරය

පුනරුත්ථාපන කාර්යාංශය මූලිකවම රාජ්‍ය ප්‍රදාන මගින් ක්‍රියාත්මක වන අතර කාර්යාංශය විසින් වෙනත් කිසිදු ආදායමක් හෝ අරමුදලක් උත්පාදනය නොකෙරේ. ස්වභාවය අනුව එය ප්‍රධාන කොටස් 03 කට බෙදිය හැකි වේ. ඒවා නම් මහා භාණ්ඩාගාරය වෙතින් වැටුප් හා චේතන සඳහා වන පුනරාවර්තන ප්‍රදාන, අනෙකුත් වියදම් සඳහා වන පුනරාවර්තන ප්‍රදාන සහ ප්‍රග්ධන ස්වභාවයේ වියදම් සඳහා වන ප්‍රග්ධන ප්‍රදාන වේ. කාර්යාංශය වෙත මාරු කරන අරමුදල් ප්‍රමාණය වාර්ෂික අයවැය ප්‍රතිපාදන මත තීරණය වේ. වර්ෂය අවසාන දිනට ඉතිරිව ඇති අයවැය ප්‍රතිපාදන වර්ෂය අවසානයේදී අවසන් වී නව වසර සඳහා නව අයවැයක් ආරම්භ වන හෙයින් එය මහා භාණ්ඩාගාරය වෙතින් අයවිය යුත්තක් ලෙස හඳුනා ගනු නොලැබේ.

වර්ෂය තුළ ලැබෙන සියලුම පුනරාවර්තන හා ප්‍රග්ධන ලැබීම් මුදල් පදනම මත මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි වර්ෂයට අදාළ ලැබීම් ලෙස හඳුනාගැනේ. මෙය ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර 11 - හුවමාරු නොවන ගණුදෙනු වලින් වන අයභාරය (බදු සහ පැවරුම්) අනුව සිදු කෙරේ.

6. වියදම්

කාර්යාංශයේ සියලු වියදම් උපචිත පදනම මත හඳුනාගැනේ. වර්ෂයට අදාළව දැරූ නොදැරූ සියලු වියදම් මූල්‍ය ප්‍රකාශන වල වර්ෂයට අදාළ වියදම් ලෙස හඳුනාගැනේ.

7. සේවක ප්‍රතිලාභ

7.1 නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්

පුනරුත්ථාපන කාර්යාංශය 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත අනුව සේවකයන්ට විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීමට බැඳී සිටී. වර්තමානයේ රට තුළ පවතින ආර්ථික තත්ත්වය හේතු කොට ගෙන මහා භාණ්ඩාගාරය වෙතින් අරමුදල් සම්පාදනය කර ගැනීමට නොහැකි වන බැවින් 2025 වර්ෂය තෙක් පාරිතෝෂිත වෙන් කිරීම් වලට සමාන සැලසුම් කළ වත්කමක් පවත්වාගෙන නොයෑමට තීරණය කරන ලදී. එලෙසම වර්තමානය වන විට කාර්යාංශයට අයත් සියලුම සේවකයින් කොන්ත්‍රාත් පදනම මත සිටින බැවින් 2023 වර්ෂය සඳහා වෙන් කිරීමක් සිදු නොකරන ලදී.

7.2 නිර්වචිත දායක සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

කාර්යාංශයේ සේවකයින් අදාළ නීති රෙගුලාසි වලට අනුකූලව සේවක අර්ථසාධක අරමුදලට හා සේවකභාරකාර අරමුදලට හිමිකම් ලබයි. සේවකයින්ගේ පුද්ගලික පාරිශ්‍රමිකයෙන් 12% හා 3% කාර්යාංශය විසින් දායකත්වය කරනු ලබන අතර සේවකයින්ගේ පුද්ගලික පාරිශ්‍රමිකයෙන් 8% අඩුකර මුළු වටිනාකම පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට ප්‍රේෂණය කරනු ලබයි.

2023 වර්ෂය තුළදී කොන්ත්‍රාත් පදනම මත සිටි සේවකයින් ස්ථීර පදනමට අන්තර්ග්‍රහණය කර ගත නොහැකිවීම නිසා 2023 දෙසැම්බර් 31 දින දක්වා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල වෙත කාර්යාංශය විසින් 12% ක්ද අදාළ සේවකයාගෙන් 8 % ක්ද දායක මුදල් ප්‍රේෂණය කර යවන ලදී.

8. සුවිශේෂී ගිණුම්කරණ ඇස්තමේන්තු සහ තීරණ

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් හඳුනාගැනීම හා මැනීම පිළිබඳ විවිධ තීරණ, ඇස්තමේන්තු හා උපකල්පන සිදු කරනු ලැබේ. වත්කම්, වගකීම්, ආදායම් හා

වියදම් හඳුනා ගැනීම හා මැනීම සඳහා වඩාත් සුවිශේෂී ලෙස බලපානු ලබන ඇස්තමේන්තු හා උපකල්පන පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

8.1 ක්ෂය කළ හැකි වත්කමක ඵලදායි ජීව කාලය

කාර්යාංශය විසින් ක්ෂය කළ හැකි වත්කමක ඇස්තමේන්තු කළ ඵලදායී ජීව කාලය සෑම වාර්තා කරනු ලබන දිනකදීම, වත්කමේ අපේක්ෂිත ආර්ථික උපයෝජනය මත පදනම්ව සමාලෝචනය කරනු ලැබේ.

9. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය


මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර 02 නියම කර ඇති පරිදි සෘජු ක්‍රමය උපයෝගී කොට ගෙන පිළියෙල කොට ඇත. මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් කටයුතු වලින්, මූල්‍ය කටයුතු වලින් හා ආයෝජන කටයුතු වලින් ලැබෙන දළ මුදල් ලැබීම් හා මුදල් ගෙවීම් හඳුනා ගනු ලැබේ. මුදල් හා මුදල් සමාන දෑ ප්‍රධාන වශයෙන්ම බැංකු ගිණුමේ පවතින ශේෂයෙන් සමන්විත වේ.

10. වාර්තාකරන දිනෙන් පසු සිදුවීම්

වාර්තාකරන දිනෙන් පසු සිදුවන සියලුම ප්‍රමාණාත්මක සිදුවීම් සලකා බලා සුදුසු සංශෝධන හා හෙළිදරව් කිරීම් ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර 6 අනුව මූල්‍ය ප්‍රකාශන වල අවශ්‍ය පරිදි සිදු කරනු ලැබේ.

විගණකාධිපති වාර්තාව
2023

10. විගණකාධිපති වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. JLO/A/BCGR/FA/2023/50
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2024 ජූලි 31 දින

පුනරුත්ථාපන කාර්යාංශය
Act/Acctt
01 AUG
02
BUREAU OF REHABILITATION

කොමසාරිස් ජනරාල්,
පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය

පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත්: 01. ලේකම්, මූදල් ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
02. ලේකම්, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල. ශ්‍රී ලංකාව
+94 11 2 88 70 28 - 34
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
+94 11 2 88 72 23
ag@auditorgen

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. JLO/A/BCGR/FA/2023/50 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2024 ජූලි 31 දින

කොමසාරිස් ජනරාල්,
පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය

පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තක්ත්වාගණනය කළ මතය

පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තක්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ කොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තක්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තක්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තක්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොළුදුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 කත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 20 හි 17 වන ඡේදය ප්‍රකාරව රු. 750,000 ක් වූ පරිගණක මෘදුකාංග අස්පෘශ්‍ය වත්කම් ලෙස දැක්විය යුතු වුව ද, දේපළ පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි.

(ආ) අධිකරණ අමාත්‍යාංශය යටතේ පැවැති මෙම කාර්යාංශය 2023 ජනවාරි 01 දින සිට ස්වාධීන ආයතනයක් ලෙස මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බැවින් ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. එමෙන්ම එහිදී 2023 ජනවාරි 01 දිනට ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ ශේෂයට ගලපා තිබූ ස්ථාවර වත්කම්වල අගය වෙනස් වීමේ ශුද්ධ ගැලපුම් වටිනාකම රු.61,911,543 ක් විය. මෙම වටිනාකම ගණනයේදී එකතුව රු.23,485,930ක්වූ වත්කම් කාණ්ඩ 03ක අගය වැඩි වීම හා රු.638,969,433 ක් වූ තවත් වත්කම් කාණ්ඩයක අගය අඩු වීම ගණනය කළ ආකාරය පිළිබඳව සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඇ) 2023 ජනවාරි 01 දිනට ගෙවිය යුතු ශේෂය ලෙස එකතුව රු.43,053,863 ක් වූ බැරකම් පවරා ගෙන තිබුණ ද, 2022 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ සිගාස් වැඩසටහනට අනුව බැරකම් වටිනාකම රු.23,825,607 ක් වූයෙන් රු.19,228,256 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) කන්දකාඩු හා සේනපුර පුනරුත්ථාපන මධ්‍යස්ථාන වෙත පැමිණෙන සමපත් දායකයින්ගේ ප්‍රයෝජනය සඳහා ඉදිකරන ලද විවේකාගාර ගොඩනැගිලි 02 ක් සඳහා පිළිවෙලින් 2016 දෙසැම්බර් 30 දින හා 2016 දෙසැම්බර් 31 දින එනම් අමාත්‍යාංශය යටතේ ගිණුම් කැබීමේදී ගෙවන ලද රු. 3,815,021 හා රු.3,714,189 ලෙස එකතුව රු.7,529,210 ක් අත්තිකාරම් ලෙස හඳුනාගැනීම් වෙනුවට කෙරිගෙන යන වැඩ ගිණුමට ගලපා තිබුණි.

(ඉ) රු.1,375,000 ක් වටිනා වායු සමීකරණ යන්ත්‍ර 05 ක් පිරියත, යන්ත්‍රෝපකරණ හා වෙනත් උපකරණ යටතේ ගිණුම්ගත කරනු වෙනුවට පරිගණක මෘදුකාංග යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඊ) 2023 වර්ෂයට අදාළ රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල වෙනුවෙන් කාර්යාංශයේ දායකත්වය රු. 2,878,195 ක් වූ අතර, මෙය වෙනම ගිණුමකට හර නොකොට වැටුප් හා වේතන ගිණුමට හර කර තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ කත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කාර්යාංශයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් කාර්යාංශයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතු ය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර, මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවා ද යන්න සලකා බැලීමයි.

කාර්යාංශයේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතු ය. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාංශය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කාර්යාංශය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැතිවිටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාංශයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාංශයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සැපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවශ්‍යාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්

කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අබණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකි ය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කාර්යාංශය පවත්වාගෙන ගොස් තිබුණි.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණු වලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවී ය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ආ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාංශයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කාර්යාංශය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ කාර්යාංශයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	අනුකූල නොවීම
(අ) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2015 ජූලි 23 දිනැති 07/2015 විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 8 (vii) ඡේදය	එක් එක් මාසයේ දායක මුදල් ඊළඟ මාසයේ 10 වන දිනට පෙර රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට යැවිය යුතු වුව ද, අවස්ථා 10කදී රු. 1,729,038 ක මුදලක් නියමිත දිනට වඩා දින 02 සිට දින 32 ක් දක්වා ප්‍රමාදයක් සහිතව ප්‍රේෂණය කර තිබුණි.
(ආ) 2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6.6 ඡේදය	මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.
(ඇ) 2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායන් සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.4 ඡේදය	විගණන කමිටු රැස්වීම් මාස තුනකට වරක් පැවැත්විය යුතු වුව ද, කාර්යාංශය 2023 වර්ෂය සඳහා එක් විගණන කමිටු රැස්වීමක් පමණක් 2023 දෙසැම්බර් 14 වන දින පවත්වා තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාංශයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර කාර්යාංශයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) දේශීය වශයෙන් භාණ්ඩ සැපයීම සඳහා මිල ගණන් ඉදිරිපත් කරනු ලබන සියලුම ලංසු තබන්නන් එකතු කළ අගය මත බදු වෙනුවෙන් ලියාපදිංචි වී තිබිය යුතු බවත්, එසේ නොමැති නම් ගැසට් නිවේදනය අනුව ආදායම් බදු දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් විසින් සහතික කර ආයතනයේ නමට ලබාගත් සහතිකයේ ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතු බව ලංසු ලේඛනයේ සඳහන් වුව ද, කොලඊ සහිත වී ෂර්ට් 750 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනය වෙනුවෙන් තෝරාගත් ආයතනය ඒ අනුව කටයුතු කර නොතිබුණි. තවද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) අනුව විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කළ යුතු විය. මෙම මිලදී ගැනීම වෙනුවෙන් රු. 858,750 ක වියදම් දරා තිබුණද, විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කර නොතිබුණි.

(ආ) කන්දකාඩු ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයෙහි නේවාසිකාගාර 03 ක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට පෙර කොන්ත්‍රාත් ඒයදම සපුරාලීමට මූල්‍ය ප්‍රතිපාදන තිබෙන බවට සහතික වීම සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.1 ප්‍රකාරව ව්‍යාපෘතිය නියමිත කාලය තුළ අවසන් කරන බවට සහතික වීම සඳහා සම්පූර්ණ ප්‍රසම්පාදන ක්‍රියාවලියම සැලසුම් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.තවද, මෙම ඉදිකිරීම් ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය සියයට 60 ට වැඩි බැවින් අදියර I හා අදියර II කොන්ත්‍රාත්තු අතර මග නවතා දැමීමට කටයුතු කිරීම තුළින් මේ දක්වා දරන ලද එකතුව රු. 35,066,985 ක මුදල නිෂ්කාර්ය වියදමක් විය. එසේම අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/21/2084/306/094 සඳහා වූ අමාත්‍ය මණ්ඩල සංදේශයේ 3.2 ට පටහැනිව අදියර I හා අදියර II කොන්ත්‍රාත් සඳහා කොන්ත්‍රාත් වටිනාකම් ඉක්මවා පිළිවෙලින් රු.8,523,646 ක් හා රු.5,382,818 ක් එනම් සියයට 22 හා සියයට 30 ක මිල විචලනයකට ඉඩ දී තිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) දේශීය වෙළඳපොල අවස්ථාවන් විශ්ලේෂණය වෙනුවෙන් පුහුණු වැඩසටහන් 06 ක් වර්ෂය තුළ සැලසුම් කර තිබුණ ද, එක් වැඩසටහනක් පමණක් ක්‍රියාත්මක කර රු.94,005 ක වියදම් දරා තිබුණි. එය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 96 කි.

(ආ) ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය, පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය හා පුද්ගලික සමාගමක් එක්ව 2022 ඔක්තෝබර් 04 වන දින සිට වසර 05 ක් සඳහා අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම් මත පුනරුත්ථාපනලාභීන්ගේ ශ්‍රමය ලබා දෙමින් වැලිකන්ද නේවාසික ව්‍යාපාර කළමනාකරණ බල ප්‍රදේශයේ බඩ ඉරිඟු වගා ව්‍යාපෘතිය ආරම්භකර තිබුණද, එහි ඵලදාව නොලැබීම් මත එම ව්‍යාපෘතිය නතර කර තිබුණි.

(ඇ) 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් අධ්‍යයන සංචාර හා පශ්චාත් පුනරුත්ථාපනය වූවන් සඳහා ජීවනෝපාය නැංවීම යන කාර්යයන් දෙක ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) 2023 අංක 02 දරන පුනරුත්ථාපන කාර්යාංශ පනතේ 4 (ආ) ඡේදය ප්‍රකාරව ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය ඉල්ලා සිටින්නන් වෙනුවෙන් ප්‍රතිකාර හා පුනරුත්ථාපනය ලබාදීම් කාර්යාංශයේ කාර්යය හා කර්තව්‍යට ඇතුළත් වුවත්, 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට එය ඇතුළත් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සත්ත්ව ආහාර සඳහා බඩ ඉරිඟු වගා කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය 2022 හා 2023 වර්ෂය සඳහා පිළිවෙලින් රු. 39,546,017 ක් ද, රු.10,669,110 ක් ලෙස එකතුව 50,215,127 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණු අතර, වර්ෂ දෙක තුළදී රු. 12,989,795 ක වියදම් දරා තිබුණි. එසේ වුවද, දෙපාර්ශවය අතර ඇති වූ අවබෝධතා ගිවිසුම් විගණිත දින වන 2024 මැයි 03 දින වන විට දිර්ඝ කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඊ) 2023 ජූනි 27 දිනැති DMS/1869 දරන ලිපියෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද පුනරුත්ථාපන කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට වර්තමානයේ කාර්යාංශයේ සේවයේ නියුතු ස්ථිර සේවකයින් 13 ක් හා කොන්ත්‍රාත් පදනම මත බඳවාගන්නා ලද සේවකයින් 61 ක් අන්තර්ග්‍රහණය කිරීමට කටයුතු කර නොතිබුණු අතර, ත්‍රිවිධ හමුදාවේ නිලයන් 55 ක් හා සෙසු නිලධාරීන් 537 ක් ලෙස එකතුව 592 ක් කාර්යාංශයේ රාජකාරි සඳහා අනුයුක්ත කර තිබුණි.

(උ) කාර්යාංශයේ සේවක සුභසාධක අරමුදලක් මගින් පවත්වාගෙන යනු ලබන තෘතීයික හා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය (සේනපුර) විසින් බ්ලොක් ගල් හා වී වගා ව්‍යාපෘතිය පුනරුත්ථාපනලාභීන්ගේ ශ්‍රම දායකත්වයෙන් පවත්වාගෙන යනු ලබන අතර, විගණනයට ලද තොරතුරු අනුව වී වගා ව්‍යාපෘතියේ 2023 සැප්තැම්බර් 14 දිනට වී අලෙවි ආදායම රු. 1,164,500 ක් විය. එසේ වුවද පුනරුත්ථාපනලාභීන්ගේ ශ්‍රමදායකත්වය වෙනුවෙන් කිසියම් ආර්ථික ප්‍රතිලාභයක් ඔවුන් වෙත ලබාදීමේ වැඩපිළිවෙලක් නොවීය.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

10. සාරාංශය

පුනරුත්ථාපන කාර්යාංශය මගින් ආරම්භ කරන ලද පුනරුත්ථාපන ක්‍රියාවලිය යටතේ ඉතාම කෙටි කාලයක් තුල මානුෂිය මෙහෙයුම් වලට සමගාමීව ශ්‍රී ලංකා රජයට භාරවූ නොමගගිය සටන්කරුවන් පුනරුත්ථාපනය කොට සමාජයට වැඩදායි පුද්ගලයන් ලෙස නැවත සමාජගත කිරීම සඳහා සුදුසු පුනරුත්ථාන ක්‍රමවේදයක් සහ අන්තරායකර ඖෂධ වලට ඇබ්බැහි වූ තැනැත්තන් එම තත්ත්වයෙන් මුදවා යහපත් පුරවැසියන් වශයෙන් සමාජගත කිරීම සඳහා ක්‍රියාත්මක පුනරුත්ථාපන වැඩසටහන් පරිපූර්ණ වැඩසටහන් ලෙස සාර්ථකව සිදු කිරීමට හැකි විය.

මෙම කාර්යාංශය වෙතින් සිදු කරනු ලබන පුනරුත්ථාපන ක්‍රියාවලියේ සාර්ථකත්වය පිළිබඳ දේශීය මෙන්ම ජාත්‍යන්තර වශයෙන් විවිධ විද්වතුන් හා ජන කොටස්හි නිරන්තර ප්‍රශංසාවට ලක් වී ඇත. මෙම පුනරුත්ථාපන ක්‍රියාදාමය ජාත්‍යන්තර පිළිගත් ක්‍රමවේදයන් මෙන්ම ශ්‍රී ලංකාවටම ආවේණික වූ සංකල්ප හා ක්‍රියාකාරකම්යටතේ ක්‍රියාවට නැංවීම එහි ඇති සුවිශේෂිත්වය වේ.

කාර්යාංශය මගින් සිදු කරනු ලබන පුනරුත්ථාපන ක්‍රියාවලිය අවසන් කිරීමෙන් පසු සමාජගත කරන ලද පුනරුත්ථාපනලාභින්ගෙන් බහුතරයක් මේ දක්වා සමාජ විරෝධී හෝ ත්‍රස්ත ක්‍රියාකාරකම් සඳහා යොමු නොවීම පුනරුත්ථාපන ක්‍රියාවලියේ සාර්ථකත්වය විද්‍යාමාන කර ඇත. තවද සමාජගත කිරීමෙන් පසු පුනරුත්ථාපනලාභින් ආර්ථික හා සාමාජීය වශයෙන් සුබසාධනය ඇති කිරීමේ අදිටනින් මෙම කාර්යාංශය යටතේ ස්ථාපිත පුනරුත්ථාපනය වූවන්ගේ ආර්ථික, සාමාජීය හා සුබසාධක කටයුතු සම්බන්ධීකරණ කාර්යාල 13ක් දිවයින පුරා ක්‍රියාත්මක කර ඇත.

අන්තරායකර ඖෂධ වලට ඇබ්බැහි තැනැත්තන් මෙම කාර්යාංශය යටතේ ක්‍රියාත්මක පුනරුත්ථාපන මධ්‍යස්ථානයන්හි නේවාසිකව පුනරුත්ථාපනය වී නැවත සමාජගත කිරීමෙන් පසු සමාජයට වැදගත්/ අත්‍යාවශ්‍ය පුද්ගලයකු වශයෙන් දායක කිරීමේ අදිටනින් පුනරුත්ථාපනයෙන් ඔබ්බවීයන තේමාව යටතේ සුවිශේෂී ක්‍රියාකාරකම් රැසක් මේ වන විට ක්‍රියාත්මක කොට ඇත.

නේවාසික පුනරුත්ථාපනලාභින්ගේ පුනරුත්ථාපන කටයුතු වලට අමතරව තරුණ පිරිස හා පාසල් දරුවන් මේ වන විට මත්ද්‍රව්‍ය වලට යොමු වීමේ වැඩි ප්‍රවණතාවයක් දක්නට ලැබෙන බැවින් එම පිරිස් එයින් මුදවා ගැනීමට හා සමාජය තුල විෂ මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය වැලැක්වීම ඉලක්ක කර ගනිමින් මෙම කාර්යාංශය මගින් සුවිශේෂී වූ වැඩසටහන් මෙන්ම දැනුවත් කිරීමේ වැඩසටහන් ද නිරන්තරයෙන් ක්‍රියාවට නංවනු ලැබේ.

සමාජගත පුනරුත්ථාපනලාභින්හට වඩා ඵලදායි පුනරුත්ථාපන ක්‍රියාවලියක් සිදු කිරීම වෙනුවෙන් රාජකාරි නියුතු කාර්ය මණ්ඩලය සඳහාප්‍රතිකාර හා පුනරුත්ථාපනය පිළිබඳ අවශ්‍ය දැනුම හා පුහුණුව ලබා දීමට පුහුණු වැඩසටහන් හා පුහුණු පාඨමාලාවන් සඳහා ඔවුන් සහභාගි කර ගනිමින් සමාජයට යහපත් පුරවැසියන් පිරිසක් බිහි කිරීමට පුනරුත්ථාපන කාර්යාංශය කැපවී සිටී.

දැනට ක්‍රියාත්මක පුනරුත්ථාපන කටයුතු තවදුරටත් පුළුල් කරමින් අන්තරායකර ඖෂධ වලට ඇබ්බැහි වූවන් එයින් මුදවා ගනිමින් සමාජයට වැඩදායි පුද්ගලයන් වශයෙන් සමාජගත කිරීමට කැපවීමෙන් ක්‍රියා කරන අතර, ඒ හරහා මතින් නිදහස් රටක් නිර්මාණය කිරීම මෙම කාර්යාංශයේ ඒකායන අරමුණ වේ.




2024 සැප්තැම්බර් මස 24 දින.

ඩීඩීයුකේ හෙට්ටිආරච්චි ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියු පීඑස්සී එම්ඒ
මේජර් ජෙනරල් (විශ්‍රාමික)
පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්

ඇමුණුම් :-

1. ඇමුණුම "අ - පුනරුත්ථාපන කාර්යාංශ සඳහා කාර්ය මණ්ඩලය අනුමත කරවා ගැනීමට අදාළ ලිපිය.

2. ඇමුණුම "ආ" - පුනරුත්ථාපන කාර්යාංශ මූලස්ථානයේ සහ ඒ යටතේ ස්ථාපිත පුනරුත්ථාපන මධ්‍යස්ථාන/ පුනරුත්ථාපනය වුවන්ගේ ආර්ථික, සමාජීය හා සුභසාධක කටයුතු සම්බන්ධීකරණ කාර්යාලයන්හි රාජකාරියේ නිරත ත්‍රිවිධ හමුදා නිලධාරි/සෙසුනිලයින් හා ස්ථිර/කොන්ත්‍රාත් සිවිල් කාර්ය මණ්ඩලයේ සංඛ්‍යා වාර්තාව - 2023.12.31



ඇමුණුම 01

අනුමත සංවිධාන රාමුව – පුනරුත්ථාපන කාර්යාංශය

අනු අංකය	තනතුරු නාමය	මාට්ටිය සේවය (ප්‍ර.අ.වෘ.ම. 02/2016 සහ 02/2016(1) අනුව)	අනුමත කරනු ලබන තනතුරු ගණන
01	පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් *	අතිවිශේෂ (රු.91645.00+රු.7800.00)	01
02	අතිරේක පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්	HM 1-3	01
03	කොමසාරිස් (පුනරුත්ථාපන)	HM 1-2	01
04	කොමසාරිස් (පාලන)	HM 1-2	01
05	ප්‍රාදේශීය / නියෝජ්‍ය කොමසාරිස් (පාලන)	MM 1-1	01
06	ප්‍රාදේශීය / නියෝජ්‍ය කොමසාරිස් (ප්‍රතිකාර)	MM 1-1	01
07	ප්‍රාදේශීය / නියෝජ්‍ය කොමසාරිස් (පුනරුත්ථාපන)	MM 1-1	01
08	පුනරුත්ථාපන වෛද්‍ය නිලධාරි	MM 1-1	03
09	ජීවී නිලධාරි	MM 1-1	01
10	ගණකාධිකාරී	MM 1-1	01
11	ප්‍රධාන්තර විමර්ශක	MM 1-1	01
12	ගණකාධිකාරී පුනරුත්ථාපන අධිකාරී	JM 1-1	06
13	අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්	JM 1-1	01
14	පරිපාලන නිලධාරී	JM 1-1	01
15	පැ.ප්‍රසූති නිලධාරී	JM 1-1	02
16	පුනරුත්ථාපන නිලධාරී	MA 3-2	13
17	භාණ්ඩ පරිවර්තක	MA 4	01
18	උපකල්ගත නිලධාරී (පුනරුත්ථාපන)	MA 4	22
19	උපකල්ගත සහකාර (පුනරුත්ථාපන)	MA 2-2	37
20	පරිවර්තක අත්‍යවශ්‍ය උපකල්ගත	MA 2-2	10
21	අසෘණ්‍ය සහකාර	MA 2-2	05
22	තාක්ෂණ සහකාර	MA 2-1	02
23	කළමනාකරණ සහකාර	MA 1-1	67
24	කළමනාකරණ සහකාර ★	MA 1-1	07
25	රියදුරු	PL – 3	36
26	ජල නල කාර්මික /ජල මෝටර් ක්‍රියාකරු	PL – 1	03
27	විදුලි කාර්මික/ජනක ඵන්ජ ක්‍රියාකරු	PL – 3	03
28	ඉන්ක්‍රැමී	PL – 2	06
29	ෆාන්ක්‍රැමී ★	PL – 2	04
30	කාර්යාලීය	PL - 2	01
31	රෝහල් සේවක	PL – 2	01
32	කාර්යාලාධාර සේවික	PL – 1	01
33	කාර්යාල කාර්ය සහායක	PL - 1	07
34	කාර්යාල කාර්ය සහායක ★	PL – 1	01
35	කම්කරු	PL - 1	07
36	පරිපාරක්ෂක කම්කරු	PL – 1	04
37	පරිපාරක්ෂක කම්කරු ★	PL – 1	01
		එකතුව	262

• 2023.01.24 දින සම්මත වී ඇති 2023 අංක 2 දරන පුනරුත්ථාපන කාර්යාංශය පනතෙහි 15.(1) උප වගන්තිය අනුව පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් තනතුරෙහි බුර කාලය වසර 02ක් වන බැවින් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට යටත්ව අනුමත කර ඇත. මෙම තනතුර පදනම් HM 2-1 වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් පියවර වන රු.91645.00 අදාළ වේ.

★ 2014.11.12 දිනැති රාජ්‍ය පරිපාලන වක්‍රලේඛ අංක 25/2014ට අනුව ස්ථිර පත්වීම් ප්‍රදානය කරන ලද නිලධාරීන් සඳහා දරන්නාට පෞද්ගලික වන සේ මෙම තනතුරු අනුමත කර ඇති බැවින්, තනතුර දරන්නා විශ්‍රාම යාම හෝ සේවයෙන් ඉවත්ව යාම හෝ නීත්‍යානුකූල ඇති වන ප්‍රධාන්පාවකට පත්කිරීම මත හෝ වෙන් යම් කරුණක් මත තනතුර ප්‍රධාන්වූ විගසින් එම තනතුරු අහෝසි වේ.

2023.06.23

එම්.ඒ. සෝමරත්න
නියෝජ්‍ය අධ්‍යක්ෂ
පෞද්ගලාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
මහ ලේකම්ගේ කාර්යාලය

වාර්ෂික වාර්තාව - 2023
ඇමුණුම 'ආ'

පුනරුත්ථාපන කාර්යාංශ මූලස්ථානයේ සහ ඒ යටතේ ස්ථාපිත පුනරුත්ථාපන මධ්‍යස්ථාන/ පුනරුත්ථාපනය වූවන්ගේ ආර්ථික, සමාජීය හා සුභසාධක කටයුතු සම්බන්ධීකරණ කාර්යාලයන්හි රාජකාරියේ නිරත නිවිධ හමුදා නිලධාරි /සෙසු නිලයින් හා ස්ථිර/කොන්ත්‍රාත් සිවිල් කාර්ය මණ්ඩලයේ සංඛ්‍යා වාර්තාව - **2023.12.31** දිනට

අ/අ	රාජකාරී ස්ථානය		හමුදා නිලධාරි/ හමුදා සෙසු නිල			සිවිල් නිලධාරි/නිලධාරිනියන් හා සෙසු කාර්ය මණ්ඩලය																		එකතුව
			පුනරුත්ථාපන කොමිසාරිස් ජනරාල්	යුධ හමුදා නිලධාරීන්	යුධ/ඉවත් හමුදා සෙසු නිලයින්	ගණකාධිකාරි	අභ්‍යන්තර විගණන නිලධාරි	සිවිල් පාලන නිලධාරි	භාෂා පරිවර්තක	ප්‍රධාන ලිපිකරු	ආහාර ලිපිකරු	උපදේශන නිලධාරි	කළමනාකරණ සහකාර (තාක්ෂණික)	කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)	විදුලි කාර්මික/ලිපිකරු	කාර්යාල කාර්ය සහායක	අත්කැණි	ඡේදාගාර ශේවක	මෝටර් සැපයුම්කරු	රියදුරු	පහිඳුවකරු	කම්කරු	සෘජු කම්කරු	
01	පුනරුත්ථාපන කාර්යාංශය		1	14	121	1	1	1	1	1	2	0	3	10	0	4	0	0	0	0	0	0	0	**160**
02	ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - කන්දකාඩු		0	8	89	0	0	0	0	0	0	1	0	3	0	1	3	1	2	0	0	4	4	**116**
03	ආරක්ෂක රාජකාරි (කන්දකාඩු) - 9 ශ්‍රීලංකාව		0	1	67	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	**68**
04	තෘතියික හා වෘත්තීය සාක්ෂරතා පුහුණු - සේනපුර		0	8	59	0	0	0	0	0	0	0	0	1	0	0	1	0	0	0	0	1	1	**71**
05	ආරක්ෂක රාජකාරි (සේනපුර) - 7 ගැඟේබ සහ 12 ගැඟේබ		0	1	55	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	**56**
06	ඒකාබද්ධතා මධ්‍යස්ථානය - වවනියාව		0	8	39	0	0	0	0	1	0	2	0	1	0	1	1	0	0	0	0	0	0	**53**
07	ආරක්ෂක රාජකාරි (වවනියා) - 11 ගැඟේබ		0	0	29	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	**29**
08	පුනරුත්ථාපනය වූවන්ගේ ආර්ථික, සමාජීය හා සුභසාධක කටයුතු සම්බන්ධීකරණ කාර්යාලය	පොළොන්නරුව	0	1	11	0	0	0	0	0	0	0	0	1	0	0	0	0	0	0	0	1	0	**14**
09		අනුරාධපුර	0	1	5	0	0	0	0	0	0	1	0	2	0	0	0	0	0	0	0	1	0	**10**
10		කොළඹ 1	0	1	4	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	**5**
11		කොළඹ 02	0	1	5	0	0	0	0	0	0	0	0	1	0	0	0	0	0	0	0	0	0	**7**
12		කළුතර	0	1	5	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	**6**
13		ගම්පහ	0	1	8	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	**9**
14		කුරුණෑගල	0	2	8	0	0	0	0	0	0	1	0	1	0	0	1	0	0	0	0	0	0	**13**
15		පුත්තලම	0	2	6	0	0	0	0	0	0	0	0	1	0	0	0	0	0	0	0	0	0	**9**
16		මහනුවර	0	1	5	0	0	0	0	0	0	1	0	2	0	0	0	0	0	1	0	0	0	**10**
17		ගාල්ල	0	1	4	0	0	0	0	0	0	0	0	1	0	0	0	0	0	1	0	0	0	**7**
18		හම්බන්තොට	0	1	7	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	2	0	0	0	**10**
19		යාපනය	0	1	5	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	**6**
20		මඩකලපුව	0	1	5	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	**6**
		එකතුව	**1**	**55**	**537**	**1**	**1**	**1**	**1**	**2**	**2**	**6**	**3**	**24**	**0**	**6**	**6**	**1**	**2**	**4**	**0**	**7**	**5**	**665**